# संस्कृतभाषा

# සංස්කෘත භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

මූලික පිරිවෙණ

1

ශ්‍රේණිය

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

Scanned by CamScanner

# සංස්කෘත භාෂාව

## මූලික පිරිවෙණ

# ගුරු මාර්ගෝපදේශය

# 1 වැනි ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)


පිරිවෙන් ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : **www.nie.lk**
විද්‍යුත් ලිපිනය : **info@nie.lk**

වෙබ් අඩවිය : **pirivena.sch.lk**
විද්‍යුත් ලිපිනය : **pirivena@moe.gov.lk**



මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සංස්කෘත භාෂාව**

මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය

1 වැනි ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2019

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN 978-955-25-0503-4

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය : එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්
නො. 49, ජයන්ත වීරසෙකර මාවත,
කොළඹ 10

## පිරිවෙන් තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සවිබල ගන්වමු

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාවේ මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ තාක්ෂණික සහයෝගයෙන් මූලික පිරිවෙන් 1-5 ශ්‍රේණි සඳහා ප්‍රථම වතාවට ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධ ව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සතුටට පත්වෙමි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සඵලදායි බව උදෙසා පෙළපොත් සහ විෂය නිර්දේශ මෙන් ම ගුරු මාර්ගෝපදේශවලින් ද සැලසෙනුයේ ඉතා වැදගත් පිටුබලයකි. මෑත කාලීන ව මෙරට අධ්‍යාපන පද්ධතියෙහි ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් සංවර්ධනාත්මක තීන්දු තීරණ රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනයට ද එහි දී විශේෂ අවධානය යොමු කර ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙන ඇති මෑත කාලීන ක්‍රියාමාර්ග අතරට එක්වන තවත් සුවිශේෂ පියවරක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමේ වැඩපිළිවෙළ හැඳින්විය හැකි අතර, මූලික පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශයට ඇතුළත් ව ඇති සෑම විෂයයක් ම ආවරණය කරමින් සකස් කර ඇති ගුරු මාර්ගෝපදේශ සියල්ල පිරිවෙන් සිසුන්ගේ ඉගෙනුම් කාර්ය සාධනය ඉහළ නංවා ලීම උදෙසා සැබෑ මෙහෙවරක් වනු ඇති බව ද මගේ විශ්වාසය යි.

මෙම සත්කාර්යය වෙනුවෙන් දායක වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂතුමා සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, කෘතවේදී ස්තුතිය පිරිනමමි.

**අකිල විරාජ් කාරියවසම්**

අධ්‍යාපන අමාත්‍ය

## අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදායය සුරකිමින් ත්‍රිවිධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ථේරවාදී භික්ෂු සමාජයේ මනා පැවැත්මට උර දිය හැකි ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් හා ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි ආධ්‍යාත්මික සංවර්ධනයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීම පිරිවෙන් අධ්‍යාපනයෙන් අපේක්ෂිත ය. අනාගත ලෝක ප්‍රජාවේ යහපැවැත්ම සඳහා වූ ආදර්ශවත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමේ වගකීමෙන් අපට මිදිය නොහැකි ය.

කාලීන ව වෙනස් වන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික ක්‍රමශිල්පයන් හා විවිධ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් අනුගමනය කරමින් පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව බලාත්මක කළ යුතු ය. මානව හා භෞතික සම්පත් මනාව උපයෝජනය කර ගැනීමටත් විෂයමාලාව හා පන්ති කාමර කළමනාකරණය ඇතුළු  කළමනාකරණ ක්‍රියාවලිය වගකීමෙන් හා වගවීමෙන් යුක්ත ව හසුරුවාලීම ගුරු භූමිකාවට ආදර්ශයකි.

කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විශ්වීය පුරවැසියකු නිර්මාණය කිරීමේ අභියෝගයට ශක්තිමත් ව මුහුණ දීමට මෙම ගුරු මාර්ගෝපදේශය, ඔබට මහඟු පිටිවහලක් වනු ඇත. ශිෂ්‍ය ප්‍රජාවේ විවිධත්වය හඳුනාගෙන වඩාත් උචිත ක්‍රමශිල්පයන් යොදා ගනිමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය, ජාතික අධ්‍යාපන අරමුණු, පරමාර්ථ හා සුවිශේෂ ව පිරිවෙන් අභිමතාර්ථ සාධනයට සියලු ම පිරිවෙන් ගුරු ප්‍රජාව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**එම්. එන්. රණසිංහ**

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට ගුරුවරයාට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සන්තතිය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. තව ද ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙ මගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර**

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික අධ්‍යාපන ආයතනය

## පෙරවදන

පිරිවෙණ ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණී තලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසු කර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අච්ඡින්න ව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දෑ හිතකාමී ජන සමාජයක් පිරිවෙන මඟින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේලා සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙණ මඟින් සිදුවූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂා කර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදක නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙණ සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මඟින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදක නව විෂයමාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදු වන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක් ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මඟින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තූතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2019.04.10

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකීය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ ඍජු දායකත්වයක් නො තිබිණි.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අප පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන්, එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශීර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස්වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017-03-16 දිනැති 412'5'12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යවලට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට ඍජු ව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුදු බව, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්වල ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් තම පංති කාමරය තුළ ශිෂ්‍ය මිත්‍රභාවයෙන් හා ප්‍රබෝධාත්මක ව කටයුතු කරමින් ඉහළ සාධනයක් කරා පිරිවෙන් අධ්‍යාපනය නංවා ලීමට උත්සුක වන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය

## පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය

මහින්දාගමනයෙන් පසු ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී මහා අරිට්ඨ තෙරුන් විසින් මහා මහින්ද තෙරුන් මුලසුන තබා ථූපාරාම විහාරයේ ධර්ම මණ්ඩපයේ දී මත්තාභය තෙරුන් ප්‍රමුඛ 500ක් සංඝයා වහන්සේට විනය ඉගැන්වීමේ රාජ්‍ය මහෝත්සවයෙන් ලක්දිව පාරිවේණික අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එවක් පටන් විවිධ අවධීන්හි උන්නතියට හා අවනතියට ලක්වෙමින් ලක්වැසි ගිහි පැවිදි සුවහස් සංඛ්‍යාත ප්‍රජාවට පිරිවෙන් අධ්‍යාපනයෙන් වූ සේවාව මහාර්ඝ ය. පිරිවෙණ මගින් සාරධර්ම අධ්‍යාපනය කේන්ද්‍ර කර ගත් සමය හා සමයාන්තර ඥාණයත්, සම්භාව්‍ය හා නූතන භාෂාවනුත්, ශිල්ප කලා ඥාණයත්, ජ්‍යෝතිර්විද්‍යා වාස්තුවිද්‍යා ඥාණයත්, ආදි ඥාන සම්භාරයත්, කාලීන අධ්‍යාපනය අනුව පුද්ගල පෞරුෂයට අවශ්‍ය සියලු සාධකයනුත් සම්පාදිත කෙරේ.

21 වන සියවසේ අධ්‍යාපන ක්ෂේත්‍රය නිපුණතා පාදක ක්‍රමයට නැඹුරු විය. පිරිවෙන් අධ්‍යාපනයට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ආගන්තුක නොවුණ ද පිළිගත් ක්‍රමශිල්ප ඔස්සේ පිරිවෙණට අවශ්‍ය විෂය නිර්දේශ හා පෙළපොත් සම්පාදනය කෙරිණ. එමගින් ශිෂ්‍ය නිපුණතා මට්ටම අනුක්‍රමයෙන් වර්ධනය වන ශිෂ්‍ය මිතුරු පාඨමාලාවක් පිරිවෙන්වලට ඉදිරිපත් කෙරිණි.

ගුරුභවතුන්ට අවශ්‍ය පාඩම් සැලසුම් කිරීම සහ මිනුම් ඇගයුම් ක්‍රම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කරදීම පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට සිදුකරන්නට ලැබීම පිළිබඳ අනතිමානී ආනන්දයක් ලබමි. පන්තිකාමරය තුළ වඩාත් ඵලදායී ගුරුවරයකු වීමට ගුරු මාර්ගෝපදේශයේ එන උපදෙස්, ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් යොදා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. පාරිවේණික ගිහි පැවිදි සිසුන්ට අවශ්‍ය මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබට මේ ගුරු මාර්ගෝපදේශය මහෝපකාරී වනු ඇතැයි සිතමි.

මේ මහඟු කාර්යය යථාර්ථයක් බවට පත් කිරීමේ දී සහය වූ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයටත්, පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලයටත්, උපදේශකත්වය, සම්බන්ධීකරණය, විෂය නියාමනය හා විවිධ අයුරින් සම්පත් දායකත්වය සැපයූ සියලු පාර්ශ්වයන්ටත්, මාගේ කෘතඥතාව පිරිනමමි.

**විජිත වෙලගෙදර**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

## විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

**උපදේශකත්වය හා අනුමැතිය** : ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය

**මෙහෙයවීම** : ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර, අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

විජිත වෙලගෙදර, අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**අධීක්ෂණය** : ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම
අධ්‍යක්ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**සම්බන්ධීකරණය** : පූජ්‍ය කුකුරම්පොළ ඤාණවිමල හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන
පිරිවෙන් අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය

පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය නියාමනය** : පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති
සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය
ජාතික අධ්‍යාපන ආයතනය

පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

| | | |
|---|---|---|
| **විෂය විශේෂඥ උපදේශනය** | : | මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි<br>සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය<br>කැලණිය විශ්වවිද්‍යාලය |
| | | මහාචාර්ය ඊ. ඩබ්ලිව්. මාරසිංහ (විශ්‍රාමික)<br>භාෂා සංස්කෘතික හා ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| | | මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ<br>භාෂා සංස්කෘතික හා ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| **ලේඛක මණ්ඩලය** | : | පූජ්‍ය උඩවෙල රේවත හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර<br>අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| | | පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| | | පූජ්‍ය නිග්ගහ ඤාණින්ද හිමි<br>කථිකාචාර්ය, සීතාවකපුර පිරිවෙන් ගුරු අභ්‍යාස විද්‍යාලය<br>අවිස්සාවේල්ල |
| | | පූජ්‍ය පුස්සැල්ලෑවේ සීලවිසුද්ධි හිමි<br>ගුරු උපදේශක, නුළු/ මන්තින්දාරාම විද්‍යායතන පිරිවෙණ<br>පුස්සැල්ලාව |
| | | පූජ්‍ය හක්මන විමලජෝති හිමි<br>පරිවේණාධිපති, ර/ඇඹි/ශ්‍රී රෝහණ වනවාස මූලික<br>පිරිවෙණ, කඩමුදුන, බුළුතොට |
| | | පූජ්‍ය කන්තලේ නාගිත හිමි,<br>පරිවේණාචාර්ය, කෑ/ සදර්ථෝදය මහ පිරිවෙණ<br>ඇඳුරාපොත, දේවාලේගම |
| **භාෂා හා විෂය කරුණු සංස්කරණය** | : | මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ<br>භාෂා සංස්කෘතික හා ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| | | නදී අමා ජයසේකර<br>ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ, විභාග දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |

| | | |
|---|---|---|
| **සෝදුපත් කියැවීම** | : | පූජ්‍ය උඩවෙල රේවත හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර<br>අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| | | පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **පරිගණක වදන් සැකැසීම** | : | පූජ්‍ය රූපහ ඤාණරතන හිමි<br>නියෝජ්‍ය පරිවේණාධිපති<br>ගම්/ශාසනවර්ධන මූලික පිරිවෙණ, මීරිගම |
| | | පූජ්‍ය අබේසේකරගම විජිත හිමි<br>පරිවේණාධිපති, ගා/ශ්‍රී රේවත මහ පිරිවෙණ<br>කුඹල්වැල්ල, ගාල්ල |
| | | පූජ්‍ය රඹාවැවේ විජිතරතන හිමි<br>පරිවේණාධිපති, අ/ශ්‍රී සදානන්ද මහ පිරිවෙණ<br>පෙරියකුලම |
| | | පූජ්‍ය පුවරසන්කුලමේ විමලානන්ද හිමි<br>පරිවේණාචාර්ය, ගම්/ශ්‍රී ධීරානන්ද මූලික පිරිවෙණ<br>මාවරමණ්ඩිය, හෙයියන්තුඩුව |
| | | ඩී. ජී. සුනිල්<br>පරිවේණාචාර්ය, ගා/ශ්‍රී විජයානන්ද මූලික පිරිවෙණ<br>හබරකඩ, තවලම |
| **පිටකවර නිර්මාණය** | : | ජේ. එම්. තරිඳු හසංග<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණය)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **විවිධ සහාය** | : | පී. ජී. බී. බුද්ධිකා<br>රාජ්‍ය කළමනාකරණ සහකාර |

## ගුරුමාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

ලෝකයේ ප්‍රචලිත ව පැවැති හා පවතින සියලු භාෂා ඇතැමුන් විසින් ජීවභාෂා, මෘත භාෂා හා සම්භාව්‍ය භාෂා යනුවෙන් වර්ගත්‍රයකට බෙදා-දක්වනු ලැබේ. ජීවභාෂා යනු අද්‍යතන ව්‍යවහාරයේ පවතින සිංහල, දෙමළ, ඉංග්‍රීසි, ජර්මන්, ජපන් ආදි භාෂාවෝ ය. මෘතභාෂා හෙවත් මළබස් යනු කලින් ව්‍යවහාරයේ පැවැත, අද ව්‍යවහාරයෙන් ගිලිහී-ගොස් ඇති භාෂා ය. මධ්‍යතන ප්‍රාකෘත භාෂා වූ ශෞරසේනී, අපභ්‍රංශ, ආවන්තී, ප්‍රාච්‍යා ආදිය උදාහරණ ය. බහුතර ජනයා විසින් වැවහර නොකරනු ලබන භාෂා වුව ද, ආගමික හා ශාස්ත්‍රීය අගයකින් යුත් ලතින්, සංස්කෘත හා පාලි වැනි භාෂාවෝ සම්භාව්‍ය භාෂා ගණයට අයත් වෙති.

ලෝකයේ පවත්නා සම්භාව්‍ය භාෂා අතුරින් සංස්කෘතයට හිමි වන්නේ අද්විතීය ස්ථානයෙකි. යුරෝපයේ හා ආසියාවේ ප්‍රචලිත ග්‍රීක හා ලතින් ඇතුළු භාෂා බහුතරයෙක මූලභාෂාව ලෙස සැලැකෙන්නේ සංස්කෘතය යි. එය ඉතා පොහොසත් වාක්කෝෂයකින් හා අතිශයින් සංකීර්ණ ව්‍යාකරණයකින් ද සමන්විත අතිප්‍රබල පෞරුෂයක් ඇති භාෂාවකි. ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් උරුම කොට ඇති එය සංගීතය, නර්තනය, නාට්‍යය, චිත්‍රකලාව, මූර්තිශිල්පය වැනි පෙරදිග කලාවන් මෙන් ම කාව්‍යශාස්ත්‍රය, වෛද්‍යවිද්‍යාව, පුරාවිද්‍යාව, ආයුර්වේදය, ජ්‍යොතිශ්ශාස්ත්‍රය වැනි ශාස්ත්‍රීය විෂයයන් සමග ද අත්‍යන්තයෙන් බැඳී-පවතින්නා වූ භාෂාවකි. සිංහලය හා සියලු උත්තර භාරතීය භාෂාවන් හදාරන විද්‍යාර්ථීනට එබස පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබීම ඉතා ප්‍රයෝජනවත් ය. අද ප්‍රචලිත හින්දි ගුජරාටි, මරාටි ආදි සියලු භාරතීය භාෂා දොඩන්නවුනට වඩා සංස්කෘත වචන නිවැරදි ව උච්චාරණය කළ හැක්කේ සිංහල භාෂකයනට ය. සිංහල වාක්කෝෂයෙන් සියයට අනූවක් ම සමන්විත ව ඇත්තේ තත්සම ස්වරූපයෙන් භාවිත වන සංස්කෘත වචන හා ඒවායින් බිඳී-ආ තද්භව රූපවලිනි. සංස්කෘතයේ ආධිපත්‍යයට යට වී තුබුණු සිංහලය ඉන් මුදාගැනීමට ප්‍රබල සටනක් ගෙනගිය කුමාරතුංග මුනිදාසයන් සිංහල ගුරුවරුනට දුන් මුඛ්‍ය උපදේශය නම් ඔවුන් විසින් පුරාණ භාෂාවක් වශයෙන් සංස්කෘතය අනිවාර්යයෙන් උගත යුතු බව යි. සෙනරත් පරණවිතාන, ආනන්ද කුමාරස්වාමි ආදීන් ලෝ පතළ උගතුන් බවට පත් වූයේ ඔවුන් සතු ව තුබූ සංස්කෘත ඥානය නිසා බව අප අමතක නොකළ යුතු ය.

සංස්කෘතය මළ බසෙකැයි කියමින් එ බස ඉගැනීම නිෂ්ඵල ව්‍යායාමයෙකැ යි පවසන්නෝ අඥානයෝ ය. සංස්කෘතය කිසි ලෙසෙකිනුත් මළබසෙක් නො වේ. තව මත් සංස්කෘතයෙන් ග්‍රන්ථ රචනා වෙමින් පවතින අතර එය මවුබස ලෙස වහරන සුළු පිරිසක් හෝ අද ද භාරතයේ වාසය කරති. ලෝකයේ උසස් යැ යි සම්මත විද්‍යා නිකේතනයන් වන ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ්, හාර්වර්ඩ්, චිකාගෝ, ජර්මනියේ ගොටින්ජන්, ඕස්ත්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයය ආදියෙහි සංස්කෘතය සම්භාව්‍ය භාෂාවක් වශයෙන් ඉගැන්වේ. සංස්කෘතභාෂා අධ්‍යයනය අන් කිසිවකුටත්

වඩා වැදගත් වනුයේ ශ්‍රී ලාංකිකයන් වන අපට ය. එ බස හදාරන්නා මනා පෞරුෂයකින් හෙබි, සදාචාරසම්පන්න, පරිපූර්ණ මිනිසකු බවට පත් කිරීමේ ශක්තිය සංස්කෘතය සතු ව ඇත. එහෙයින් අපේ පාසල්වල සංස්කෘතය විෂයයක් වශයෙන් හැදෑරීම දිරිමත් කළ යුතු ය.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මූලික පිරිවෙන් තුළ වඩාත් ඵලදායී ව සහ සුගම ව සංස්කෘත භාෂාව ඉගැන්වීමේ උදාර අරමුණෙන් මෙම ගුරු මර්ගෝපදේශය නිපුණතා පාදක ව සම්පාදනය කර ඇත. ශිෂ්‍යයා කෙරෙහි වඩාත් පරිපූර්ණ ශික්ෂණයක්, විචාරපූර්ව චින්තනයක්, සහ ප්‍රගතිශීලී නිර්මාණ කෞශල්‍යයක් උත්පාදනය කිරීම, මේ තුළින් අපේක්ෂා කෙරේ. පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා තුළ ධනාත්මක වූත් ප්‍රබෝධාත්මක වූත් සිතුවිලි හා ක්‍රියාකාරකම් නොමැති නම් 'උල්පතට ඉහළින් ගඟ ගලන්නේ නැතිවා සේ' අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නොහැකි වනු ඇත. ඒ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ වටිනා ම සම්පත වූ ගුරු සම්පතට අයත් ඔබ ගේ උද්‍යෝගය මත මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් ප්‍රායෝගික වනු ඇත. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය මුල සිට සැලකිල්ලෙන් කියවා හොඳින් අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය පිළිබඳ ගුරුවරයකු ලෙස ඔබට මේ වන විටත් හොඳ අවබෝධයක් ඇත. යම් විෂයයක් පිළිබඳ සිසුන් නිපුණයින් වීමට නම් ඇසීම, දැකීම හා කිරීම යන අංශ තුනෙහි ම ක්‍රියාකාරී ව යෙදිය යුතු ය. තමා උගත් දේ ප්‍රායෝගික ජීවිතයේ දී සුසංයෝගී ව යොදා ගැනීමේ හැකියාව ඇත්නම් ඔහු නිපුණයෙකි.

2019 වර්ෂයේ සිට ඔබ භාවිත කරන මෙම ගුරු මාර්ගෝපදේශය තුළින් දරුවන් විභාගයෙන් සමත් කරවීම ම පමණක් එක ම අරමුණ නො විය යුතු වේ. ඔබ ගේ ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යයෙන් ශ්‍රේෂ්ඨ ගණයේ පුරවැසියකු බිහි කිරීම ප්‍රධාන අරමුණ විය යුතු අතර විශිෂ්ට ලෙස විභාග සමත්වීම සිසුන් ලබන අතිරේක ප්‍රතිලාභයකි. අධ්‍යාපනයෙන් විභාග සමත්වීමේ නිපුණතාව නොව ධාර්මික ජීවිතයක් ගත කිරීමේ නිපුණතාව ඇති කළ යුතු ය.

මූලික පිරිවෙන් සංස්කෘත විෂය නිර්දේශය සමස්ත වශයෙන් නිපුණතා 10ක් ඔස්සේ විස්තාරණය වී ඇති අතර ඒ අතුරින් පළමු වන ශ්‍රේණිය සඳහා නිපුණතා 05ක් ද, දෙවන ශ්‍රේණිය සඳහා නිපුණතා 06ක් ද, තෙවන, සිව් වන, පස් වන ශ්‍රේණිවල දී සමස්ත නිපුණතා 10 ම ද, වශයෙන් සිරස් ව ගැඹුරටත්, තිරස් ව පුළුල් වත්, විහිදේ. අනතුරු ව එම නිපුණතාවලින් නියමිත ශ්‍රේණියේ දී සාක්ෂාත් කර ගත යුතු යැ යි අපේක්ෂිත කොටස නිපුණතා මට්ටම් ලෙස දක්වා එහි සීමා නිශ්චය කරමින් ඉගෙනුම් පල ඉදිරිපත් කර ඇත. ඊට අදාළ විෂය සන්ධාරය තීරණය කර ඇත්තේ එම ඉගෙනුම් පල පදනම් කර ගනිමිනි.

ගුරුවරයාට පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී කළ යුතු කාර්යභාරය දැක්වීමට ක්‍රියාකාරකම් සැලැසුම් සකස් කර ඇත. එ මගින් ගුරුවරයා අවශ්‍ය ඉලක්කය කරා දිශාභිමුඛ කෙරෙන අතර කාලච්ඡේදවල දී සුදුසු පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යය කිරීමට හැකි වන සේ පාඩම් සැලැසුම් සකසා ගැනීම ගුරු අභිමතය පරිදි කරනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

යෝජිත කාලය තුළ අදාළ විෂය කරුණු ග්‍රහණය කර ගැනීමෙන් පසු සිසුන්ට අත්පත් කර ගැනීමට හැකි වූ ඉගෙනුම් පල ප්‍රමාණය තක්සේරු කර බැලීම ද නිපුණතාවක් හෝ ඒකකයක් හෝ අවසානයේ සිදු විය යුතු ය.

පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිසුන්ට හා පන්තියට උචිත පරිදි වඩාත් නිර්මාණශීලි ක්‍රමයක් හා ගුණාත්මක යෙදවුම් ද භාවිත කිරීමට ගුරුවරයාට නිදහස ඇති අතර සිසුන්ගේ නිපුණතා තව දුරටත් සංවර්ධනය වීම සඳහා වැඩි දුර ගවේෂණයට යොමු කළ යුතු ය.

මෙම ගුරුමාර්ගෝපදේශය තුළ කාලච්ඡේද ගණනය කර ඇත්තේ විෂය අන්තර්ගතය පිළිබඳ සැලකිලිමත් වෙමිනි. වර්ෂයට නියමිත කාලච්ඡේද සංඛ්‍යාව නො ඉක්මවන පරිදි පාඩම් ඒකකවලට යොදා ඇති කාලච්ඡේද සංශෝධනය කර ගැනීමට හා පන්ති කාලසටහනට අනුව පාඩම් ඒකක කළමනාකරණය කර ගැනීමට ගුරුවරයාට අවකාශ ඇත. ගුරුමාර්ගෝපදේශය අවසානයේ දක්වා ඇති තක්සේරු හා ඇගයීම් ක්‍රියාවලියට අදාළ නිදර්ශක ආධාරකය ඇගයීම් උපකරණයක් ලෙස භාවිත කිරීමට ඔබට මග පෙන්වනු ඇත.

**පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි,**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති,
සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය,
ජාතික අධ්‍යාපන ආයතනය

# පටුන


පිටු අංකය

| | |
|---|---|
| ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය | iii |
| අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය | iv |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | v |
| පෙරවදන | vi |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | vii |
| පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය | viii |
| විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය | ix |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | xii |
| ජාතික අරමුණු | xvi |
| මූලික නිපුණතා | xvii |
| විෂය අධ්‍යයනයේ අරමුණු | xx |
| විෂය නිර්දේශය වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම | xxi |
| විෂය නිර්දේශය | xxiii |
| පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය | xxxii |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | |
| පාඩම 1 - දේවනාගරී අක්ෂරමාලාව | 3 |
| පාඩම 2 - ව්‍යඤ්ජනාක්ෂර | 7 |
| පාඩම 3 - දේවනාගරී සංයුක්තාක්ෂර | 11 |
| පාඩම 4 - දේවනාගරී ඉලක්කම් | 17 |
| පාඩම 5 - නාමපද | 20 |
| පාඩම 6 - ආඛ්‍යාතපද | 33 |
| පාඩම 7 - වාක්‍යනිර්මාණය - i | 37 |
| පාඩම 8 - වාක්‍යනිර්මාණය - ii | 41 |
| පාඩම 9 - නිර්දිෂ්ටග්‍රන්ථ - බාලාදර්ශය | 44 |
| පාඩම 10 - නිර්දිෂ්ටග්‍රන්ථ - බුද්ධගද්‍යය | 46 |
| පාඩම 11 - නිර්දිෂ්ටග්‍රන්ථ - සංස්කෘත පාඨමාලා 1 | 48 |
| ඇගයීම සහ තක්සේරුකරණය | 52 |

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරාගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම සහ හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා පෙර සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය**: පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(ii) **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වාර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්, චිත්තවේගී බුද්ධිය

(iii) **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(iv) **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම

තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනාගැනීම

හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(v) **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාරධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(vi) **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවනරටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(vii) **ඉගෙනීමට ඉගෙනීම පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් මගින් වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන් හට ශක්තිය ලබාදීම

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## විෂය අධ්‍යයනයේ අරමුණු

01. සිංහල හා සංස්කෘත වර්ණමාලාව පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයකට පෙළඹවීමක් ලැබීම

02. සිංහල භාෂාව නිවැරදි ව භාවිත කිරීමට මූලාධාර වීම

03. ආයුර්වේදය, ජ්‍යෝතිර්විද්‍යාව වැනි විවිධ ශාස්ත්‍ර, කලා ශිල්ප හා දර්ශනවාද ඉගැනීමේ දී ජීවභාෂාවක් වශයෙන් දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනයට ශක්තිමත් පදනමක් සැපයීම

04. ඉන්දියානු භාෂා අධ්‍යයනයට අත්වැලක් සැපයීම

05. පුරාණ ඥාන ගවේෂණය සඳහා උපකාරී වීම

06. වාග්විද්‍යාත්මක භාෂා ගවේෂණයට හා පාරිභාෂික ශබ්දමාලා සම්පාදනයට මූලාධාර වීම

07. සාහිත්‍යරසාස්වාදයට රුකුලක් වීම

08. හරධර්ම චරිතායනයට සහාය වීම

09. තොරතුරු තාක්ෂණය සඳහා විධිමත් භාෂා මාධ්‍යයක් ගොඩනැගීමට මූලාධාර වීම

10. විශ්වීය කේත (Universal code) ක්‍රමයකට අවශ්‍ය විද්‍යාත්මක භාෂා අධ්‍යයනය සඳහා රුකුලක් වීම

11. සංස්කෘත භාෂාවෙන් ලියැවී ඇති හින්දු ස්තෝත්‍ර හා බෞද්ධශ්ලෝක මගින් ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සමගියට අවශ්‍ය දායකත්වය ලබා දීම

**සංස්කෘත භාෂාව**

**විෂය නිර්දේශය පිරිවෙන් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම**

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | I | 1.1, 1.2, 1.3, 1.4, 2.1, 5.1, 5.2 | 60 |
| | II | 2.2, 2.3, 2.4, 2.5, 2.6, 3.1, 4.1, 4.2, 5.1, 5.2 | 60 |
| | III | 2.2, 2.3, 2.4, 2.5, 2.6, 3.2, 4.1, 4. 2, 5.1, 5.2 | 60 |
| | | එකතුව | 180 |

# संस्कृतपाठ्यक्रमः

සංස්කෘත විෂය නිර්දේශය

## 1 ශ්‍රේණිය

सर्वभाषासु या श्रेष्ठा - या चाद्या शास्त्रसंचयैः ।
श्रेयं संस्कृतभाषा ते - भूयाद् वृद्ध्यै शिवाय च ॥

සියලු භාෂා අතර උතුම් වූ ද, ශාස්ත්‍ර සමූහයෙන් පොහොසත් වූ ද,

සංස්කෘත භාෂාව ඔබේ දියුණුව හා යහපත පිණිස වේ වා!

## වර්ෂයකට යෝජිත කාලච්ඡේද

| ශ්‍රේණිය / නිපුණතාව | | 1 ශ්‍රේණිය | 2 ශ්‍රේණිය | 3 ශ්‍රේණිය | 4 ශ්‍රේණිය | 5 ශ්‍රේණිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | 01 | 01 | 01 | 01 | 01 | **110** |
| | කාලච්ඡේද | 40 | 25 | 15 | 15 | 15 | |
| සංස්කෘත භාෂාවේ නාමපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | 02 | 02 | 01 | 01 | 02 | **90** |
| | කාලච්ඡේද | 20 | 25 | 15 | 15 | 15 | |
| සංස්කෘත භාෂාවේ ආඛ්‍යාතපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | 03 | 03 | 03 | 03 | 03 | **95** |
| | කාලච්ඡේද | 20 | 30 | 15 | 15 | 15 | |
| සංස්කෘත භාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍යනිර්මාණය කරයි. | නිපුණතාව | 04 | 05 | 08 | 08 | 08 | **105** |
| | කාලච්ඡේද | 40 | 30 | 15 | 10 | 10 | |
| නිර්දිෂ්ට ග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි. | නිපුණතාව | 05 | 06 | 09 | 09 | 09 | **197** |
| | කාලච්ඡේද | 60 | 60 | 35 | 27 | 15 | |
| සංස්කෘත භාෂාවේ සන්ධි නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | 04 | 04 | 04 | 04 | **47** |
| | කාලච්ඡේද | - | 10 | 10 | 12 | 15 | |
| සංස්කෘත භාෂාවේ සමාසපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 05 | 05 | 05 | **37** |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | |
| සංස්කෘත භාෂාවේ තද්ධිතපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 06 | 06 | 06 | **37** |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | |
| සංස්කෘත භාෂාවේ කෘදන්තපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 07 | 07 | 07 | **37** |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | |
| උපදේශ සාහිත්‍යය හා මහාකාව්‍ය සාහිත්‍යය රසවිඳියි. | නිපුණතාව | - | - | 10 | 10 | 10 | **130** |
| | කාලච්ඡේද | - | - | 40 | 45 | 45 | |
| **එකතුව** | | 180 | 180 | 175 | 175 | 175 | 885 |

# 1 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි. | 1.1 දේවනාගරී අක්ෂරමාලාව කියවයි, ලියයි. | 1.1 දේවනාගරී අක්ෂර<br>• ස්වරාක්ෂර 14<br>• ව්‍යඤ්ජනාක්ෂර 35<br>• ව්‍යඤ්ජනාක්ෂරවලට ස්වරාරෝපණය වී ඇති ආකාරය | 1.1<br>• දේවනාගරී හෝඩිය හඬ නගා කියවයි<br>• සිංහල හෝඩියේ සහ දේවනාගරී හෝඩියේ අක්ෂර රූප සංසන්දනය කරයි.<br>• සිංහල හෝඩියේ සහ දේවනාගරී හෝඩියේ උච්චාරණයේ ඇති වෙනස සංසන්දනය කරයි.<br>• දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර කියවයි, ලියයි.<br>• දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර කියවයි, ලියයි.<br>• අකුරු ලියැවෙන නිවැරදි අනුක්‍රමය අනුගමනය කරමින් සියලු අක්ෂර ලියා දක්වයි.<br>• ව්‍යඤ්ජනාක්ෂරවලට ස්වරාක්ෂර එකතු වී ඇති ආකාරය වියුක්ත කර පෙන්වයි.<br>• ස්වරාරෝපණයේ දී ව්‍යඤ්ජනාක්ෂරවල ඇති වන විශේෂතා ඉස්මතු කර පෙන්වයි. | 40 |
| | 1.2 පිලි සහිත දේවනාගරී අක්ෂර සහ දේවනාගරී සංයුක්තාක්ෂර කියවයි, ලියයි. | 1.2 පිලි සහිත අක්ෂර සහ සංයුක්තාක්ෂර | 1.2<br>• ව්‍යඤ්ජනයකට ස්වර ආරෝපණය කොට පිලි යොදා පෙන්වයි.<br>• පිලි යෙදුණු අකුරු නිවැරදි ව කියවයි, ලියයි.<br>• ව්‍යඤ්ජන අකුරු දෙකක් හෝ ඊට වැඩි ගණනක් එකතුව සංයුක්තාක්ෂර සෑදෙන බව පෙන්වා දෙයි.<br>• සංයුක්තාක්ෂර වර්ග කිහිපයක් ඇති බව හඳුන්වා දෙයි.<br>• සරල සංයුක්තාක්ෂර කියවයි, ලියයි.<br>• විශේෂ සංයුක්තාක්ෂර කියවයි, ලියයි.<br>• පිලි සහිත දේවනාගරී සංයුක්තාක්ෂර කියවයි, ලියයි. | |

# 1 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.3 දේවනාගරී අක්ෂරවලින් සඳහන් ව්‍යවහාරයේ පවතින සරල සංස්කෘත වචන කියවයි, ලියයි. | 1.3 දේවනාගරී වචන<br>• සුලබ සරල සංස්කෘත වචන | 1.3<br>• පිළි රහිත සරල සංස්කෘත වචන ලියා පෙන්වයි.<br>• පිළි සහිත සරල සංස්කෘත වචන ලියා පෙන්වයි.<br>• පිළි සහිත සරල සංස්කෘත වචනවල ස්වර සහ ව්‍යඤ්ජන වෙන්කොට දක්වයි.<br>• සංයුක්තාක්ෂර ඇති සරල වචන කියවයි, ලියයි.<br>• පිළි සහිත සංයුක්තාක්ෂර ඇති සරල වචන කියවයි, ලියයි.<br>• විවිධ සුලබ වචන ඇතුළත් සරල සංස්කෘත ඡේද කියවයි, ලියයි. | |
| | 1.4 දේවනාගරී ඉලක්කම් කියවයි, ලියයි. | 1.4 දේවනාගරී ඉලක්කම් | 1.4<br>• 0 සිට 10 දක්වා දේවනාගරී ඉලක්කම් රූප කියවයි.<br>• 0 සිට 10 දක්වා දේවනාගරී ඉලක්කම් රූප ලියයි.<br>• 0 සිට 10 දක්වා දේවනාගරී ඉලක්කම් භාවිත කරමින් 100 දක්වා සංඛ්‍යා ගොඩනගයි. | |
| **2.0 සංස්කෘත භාෂාවේ නාමපද නිවැරදි ව භාවිත කරයි.** | 2.1 සංස්කෘත භාෂාවේ තෝරා ගත් නාමපද, ඒක වචන, ද්විවචන සහ බහුවචන ලෙස නිවැරදි ව වර්ග කරයි. | 2.1 නාමපද<br>• නාමපදවල පවතින වචනත්‍රය<br>• ඒකවචන<br>• ද්විවචන<br>• බහුවචන | 2.1<br>• මාතෘභාෂාවේ එදිනෙදා භාවිත කරන නාමපද ප්‍රකාශ කරයි.<br>• මාතෘභාෂාවේ එදිනෙදා භාවිත කරන නාමපද සංස්කෘත භාෂාවෙන් වාචික ව ප්‍රකාශ කරයි.<br>• මාතෘභාෂාවේ ඇති නාමපද ඒකවචන, ද්විවචන සහ බහුවචන ලෙස වර්ග කරමින් සංස්කෘත භාෂාවේ පවතින වචනත්‍රය සංසන්දනය කරයි. | 20 |

# 1 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | | • සංස්කෘත භාෂාවේ වචනත්‍රයට අනුව එදිනෙදා භාවිත කරන තෝරා ගත් සංස්කෘත වචන වාචික ව වර්ග කර පෙන්වයි. | |
| | 2.2 සංස්කෘත භාෂාවේ ලිඞ්ග භේදයට අනුකූල ව තෝරා ගත් වචන වර්ග කරයි. | 2.2 ලිඞ්ග භේදය<br>• පුරුෂ<br>• ස්ත්‍රී<br>• නපුංසක | 2.2<br>• එදිනෙදා භාවිත කරන සංස්කෘත වචන පුංලිඞ්ග, ස්ත්‍රීලිඞ්ග සහ නපුංසකලිඞ්ග වශයෙන් වාචික ව පෙළ ගස්වයි. | |
| | 2.3 නාමවල ශබ්ද මූලය වෙන් කරයි. | 2.3 නාමවල ශබ්දමූලය | 2.3<br>• දෙනු ලබන නාමපදයක ශබ්දමූලය ඉස්මතු කර පෙන්වයි. | |
| | 2.4 නාමයක් ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවලට අනුව වරනගයි. | 2.4 විභක්ති<br>• ප්‍රථමා සහ ද්විතීයා<br>  • අකාරාන්ත පුංලිඞ්ග සහ නපුංසකලිඞ්ග ශබ්ද<br>  • ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග ශබ්ද | 2.4<br>• එදිනෙදා භාවිත කරන අකාරාන්ත පුංලිඞ්ග සහ නපුංසකලිඞ්ග නාම, ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවල වරනගයි.<br>• එදිනෙදා භාවිත කරන ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග නාම, ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවල වරනගයි. | |
| | 2.5 නාමපද අතර සර්ව නාමපද වෙන් කර පෙන්වයි. | 2.5 සර්ව නාම<br>• සර්ව නාම හැඳින්වීම<br>• සර්ව නාම යෙදෙන අවස්ථා | 2.5 සර්ව නාම යනු මොනවා දැ යි නිදසුන් සහිත ව පහදයි. | |

# 1 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.6 විභක්තිවලට අනුව නාම නිවැරදි ව වරනගයි. | 2.6 නාම විභක්ති සහ විභක්ති අර්ථ හඳුනාගැනීම<br>• ලිඞ්ගත්‍රයට අනුව ස්වරාන්ත නාම වරනැගීම සහ වාචෝද්ගත කිරීම<br>- අකාරාන්ත<br>- ආකාරාන්ත<br>- ඉකාරාන්ත<br>- උකාරාන්ත<br>(හලන්ත අපේක්ෂා නො කෙරේ.) | 2.6<br>• නාම විභක්ති නම් කරයි.<br>• නාම විභක්තිවල අර්ථය පහදයි.<br>• ස්වරයකින් අවසන් වන නාමපද ස්වරාන්ත ලෙස නම් කරයි.<br>• දෙනු ලබන විවිධ ස්වරාන්ත නාම අකාරාන්ත, ආකාරාන්ත, ඉකාරාන්ත සහ උකාරාන්ත ලෙස පෙළ ගස්වයි.<br>• අ කාරාන්ත පුංලිඞ්ග **कुमार** ශබ්දය අනුපිළිවෙළට වරනගයි.<br>• ඉ කාරාන්ත පුංලිඞ්ග **मुनि** ශබ්දය අනුපිළිවෙළට වරනගයි.<br>• උ කාරාන්ත පුංලිඞ්ග **गुरु** ශබ්දය අනුපිළිවෙළට වරනගයි.<br>• අ කාරාන්ත නපුංසකලිඞ්ග **फल** ශබ්දය අනුපිළිවෙළට වරනගයි.<br>• ආ කාරාන්ත ස්ත්‍රීලිඞ්ග **लता** ශබ්දය අනුපිළිවෙළට වරනගයි.<br>• අකාරාන්ත, ආකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත යන අන්ත අනුව නාම වරනැගීමේ දී දැකිය හැකි වෙනස්කම් පැහැදිලි කරයි.<br>• ලිඞ්ගත්‍රයට අනුව නාමවරනැගීමේ දී දැකිය හැකි වෙනස්කම් පැහැදිලි කරයි. | |

# 1 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **3.0 සංස්කෘත භාෂාවේ ආඛ්‍යාතපද (අවසාන ක්‍රියාපද) නිවැරදි ව භාවිත කරයි.** | 3.1 ආඛ්‍යාතවල ධාතුමූලය වෙන් කරයි. | 3.1 ආඛ්‍යාතපදයක (ක්‍රියාපදයක) ධාතුමූලය | 3.1<br>• දෙනු ලබන ආඛ්‍යාත පදයක (ක්‍රියා පදයක) ධාතු මූලය ඉස්මතු කර පෙන්වයි. | 20 |
| | 3.2 ලට්, ලඞ් පරස්මෛපද ප්‍රත්‍යය සහිත ආඛ්‍යාතපද (අවසාන ක්‍රියා පද) නම් කරයි. | 3.2 ලට්, ලඞ් පරස්මෛපද ප්‍රත්‍යය<br>• හඳුනා ගැනීම<br>• වාචෝද්ගත කිරීම | 3.2<br>• දෙනු ලබන ආඛ්‍යාතපදවලට අදාළ ධාතුමූලය සහ ලට්, ලඞ් පරස්මෛපද ප්‍රත්‍යය වියුක්ත කර දක්වයි.<br>• ලට්, ලඞ් පරස්මෛපද ප්‍රත්‍යය අදාළ අනුපිළිවෙළට වාචෝද්ගත ව ඉදිරිපත් කරයි. | |
| **4.0 සංස්කෘත භාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍ය නිර්මාණය කරයි.** | 4.1 උක්තය සහ ආඛ්‍යාතය පමණක් ඇති සරල වාක්‍ය ගොඩනගයි. | 4.1 උක්තය සහ ආඛ්‍යාතය පමණක් ඇති සරල වාක්‍ය<br>• උක්තය (නාම)<br>• ආඛ්‍යාතය (ක්‍රියා) | 4.1<br>• උක්තය සහ ආඛ්‍යාතය පමණක් ඇති සරල සංස්කෘත වාක්‍ය දේවනාගරී අකුරින් ලියයි.<br>• මාධ්‍ය භාෂාවෙන් හා සංස්කෘත භාෂාවෙන් (වර්තමානකාල ප්‍රථමපුරුෂ ඒකවචන ක්‍රියාපද සහිත) පද දෙකේ වාක්‍යය ගොඩනගයි. | 40 |

# 1 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.2 පුරුෂභේදය සහ වචන භේදය සැලකිල්ලට ගනිමින් සරල වාක්‍ය ගොඩනගයි. | 4.2 පුරුෂභේදය සහ වචන භේදය<br>• ප්‍රථමපුරුෂ, මධ්‍යම පුරුෂ, උත්තමපුරුෂ<br>• ඒකවචන, ද්විවචන, බහුවචන<br><br>* 'බාලාදර්ශයේ' 1 සිට 15 දක්වා පාඩම් යොදා ගනිමින් ඉහත විෂය කොටස් ආවරණය කිරීම අපේක්ෂා කෙරේ. | 4.2<br>• ලියනු ලබන සරල වාක්‍යවල ආඛ්‍යාතය ප්‍රථම පුරුෂ, මධ්‍යමපුරුෂ සහ උත්තමපුරුෂ ලෙස කාණ්ඩ කරයි.<br>• ආඛ්‍යාතය ප්‍රථමපුරුෂ, මධ්‍යමපුරුෂ හෝ උත්තමපුරුෂ ලෙස ලිවීමට පවරනු ලැබූ විට අදාළ සරල වාක්‍යයක් නිවැරදි ව ගොඩනගයි.<br>• වාක්‍යවල ආඛ්‍යාතය ඒකවචන, ද්විවචන, බහුවචන ලෙස වර්ග කර පෙන්වයි.<br>• ඒකවචන, ද්විවචන, බහුවචන ආඛ්‍යාතය සහිත සරල වාක්‍ය ලියයි. | 40 |
| 5.0 නිර්දිෂ්ට ග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි. | 5.1 බාලාදර්ශයේ ශ්ලෝක දේවනාගරී අක්ෂරවලින් ද, සිංහල අක්ෂරවලින් ද, ලියමින් වාචෝද්ගත කරයි. | 5.1 බාලාදර්ශය 30 වෙනි පාඩම - උපදේශමාලා (අර්ථාවබෝධය ලබා දීම අපේක්ෂා නො කෙරේ.) | 5.1<br>• බාලාදර්ශයේ 30 වැනි පාඩමෙහි එන උපදේශමාලා ශ්ලෝක කට පාඩමින් කියයි.<br>• බාලාදර්ශයේ 30 වැනි පාඩම දේවනාගරී අක්ෂරවලින් ලියයි.<br>• බාලාදර්ශයේ 30 වැනි පාඩම සිංහල අක්ෂරවලින් ලියයි. | 60 |

# 1 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.2 බුද්ධගද්‍යයේ ශ්ලෝක දේවනාගරී අක්‍ෂරවලින් ද, සිංහල අක්‍ෂරවලින් ද, ලියමින් වාචෝද්ගත කරයි. | 5.2 බුද්ධගද්‍යය (බුද්ධ පද්‍යය) ශ්ලෝක 41 (අර්ථාවබෝධය ලබා දීම අපේක්‍ෂා නො කෙරේ.) | 5.2<br>• බුද්ධගද්‍යයේ ශ්ලෝක කට පාඩමින් කියයි.<br>• බුද්ධගද්‍යයේ ශ්ලෝක සිංහල අක්ෂරවලින් ලියයි.<br>• බුද්ධගද්‍යයේ ශ්ලෝක දේවනාගරී අක්ෂරවලින් ලියයි. | 60 |
| | 5.3 සංස්කෘත පාඨමාලා 01 ග්‍රන්ථය අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි. | 5.3 සංස්කෘත පාඨමාලා 01 | 5.3<br>• සංස්කෘත පාඨමාලා ගීත සිංහල අකුරින් සහ දේවනාගරී අකුරින් ලියයි.<br>• සංස්කෘත පාඨමාලා 01 හි කතන්දර කියවා, අරුත් පහදයි. | |

# නිර්දිෂ්ටග්‍රන්ථ හා පරිශීලනීය ග්‍රන්ථ (1 ශ්‍රේණිය)

## 1. නිර්දිෂ්ටග්‍රන්ථ

- සංස්කෘත භාෂාව - 01 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- බුද්ධ ගජ්ජය (බුද්ධ පද්‍යය) - සම්පූර්ණ පොත
- සංස්කෘත බාලාදර්ශය (30 පාඩම), විද්‍යාසාගර කේ. එල්. වී. ශාස්ත්‍රී, ආර්. එස්. වෛද්‍යාර් සහ පුත්‍රයෝ, ඉන්දියාව - 2007
- සංස්කෘත පාඨමාලා - 01, පූජ්‍ය බෝදාවල පියභාරති හිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන - 2016

## 2. පරිශීලනීය ග්‍රන්ථ

- සංස්කෘත අකුරු ලියමු - (01) ප්‍රාචී ප්‍රකාශන, (සංයුක්ත තැටිය සහිත ව)
- සරල සංස්කෘත ශික්ෂකය - 01, බලන්ගොඩ ආනන්ද මෛත්‍රේය මහ නාහිමි, මොඩන් පොත් සමාගම, නුගේගොඩ - 2012

## පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සංවිධානය

සම්භාව්‍ය භාෂාවක් මෙන් ම ආගමික භාෂාවක් ද වශයෙන් සංස්කෘත භාෂාව ශ්‍රී ලංකාවේත්, ලොව විවිධ රටවලත්, පුරාතනයේ සිට අද දක්වා හැදෑරීම සහ භාවිතය සිදු වේ. තාක්ෂණික අංශයෙන් දියුණු වී විශ්ව ගම්මානයක් වූ ලෝක ප්‍රජාව ගේ ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක සංවර්ධනයට පෙරටත් වඩා පරිපූර්ණ දායකත්වයක් සංස්කෘත භාෂාවෙන් ලබා ගත හැකි ය. ජාත්‍යන්තර කීර්තියට පත් ශ්‍රී ලාංකික ඇතැම් විද්වතුන් එම තත්ත්වයට පත් වීමේ ප්‍රධාන සාධකය ඔවුන් සතු සංස්කෘත භාෂා නිපුණතාව යි. සංස්කෘත භාෂාව ශාස්ත්‍රීය කටයුතු හා ආගමික කටයුතුවලට පමණක් සීමා නො කොට පිරිවෙන් පද්ධතිය තුළින් සමාජයට නව ආරකට හඳුන්වා දිය යුතු කාලය එළඹ ඇත. දැනුම ගවේෂණය කරන ක්‍රියාකාරී පුද්ගලයකු ලෙස පන්ති කාමරයට පමණක් කොටු වී ලබන අධ්‍යාපනයෙන් බැහැර ව පිරිවෙන් තුළත්, ඉන් බැහැර වත්, විවිධ වැඩසටහන් සංවිධාන කළ යුතු යි. පිරිවෙන් සංස්කෘතියට ගැළපෙන පරිදි සහ පිරිවෙනෙහි පවත්නා මානව හා භෞතික සම්පත් අනුව විෂය නිර්දේශයේ සඳහන් නිපුණතා සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම වැඩසටහන් සංවිධානය විය යුතු ව ඇත. ඒ සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

01. සංස්කෘත භාෂා දින
02. කණ්ඩායම් සංවාද
03. මාසික හා වාර්ෂික සංගම්වල දී සංස්කෘතයෙන් භාෂණය, සජ්ඣායනය
04. සංස්කෘත භාෂාව පසුබිම් කර ගත් කාව්‍ය ශාස්ත්‍රය, වෛද්‍ය විද්‍යාව, පුරා විද්‍යාව, ආයුර්වේදය වැනි තේමා පිළිබඳ ගවේෂණ
05. බිත්ති පුවත්පත් පළ කිරීම
06. උපදේශාත්මක සංස්කෘත ශ්ලෝක හා තොරතුරු එක් රැස් කිරීම
07. මවුබසේ වචන පරිණාමය වී ඇති ආකාරය පිළිබඳ සංස්කෘතය ඇසුරින් තොරතුරු රැස් කිරීම
08. දේවනාගරී අක්ෂර යොදා ගනිමින් විවිධ තොරතුරු සන්නිවේදනය සඳහා පෝස්ටර් නිර්මාණය

## තක්සේරු හා ඇගැයීම් කාර්යය

**පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ** පිරිවෙන්වලට ද අදාළ ය. ඒ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය.

ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යයේ දී ශිෂ්‍යයා අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කරගෙන ඇති ඉගෙනුම් පලවල ගුණාත්මක බව සොයා බැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගෙනුම් පලවලට ළඟා වන ආකාරය හඳුනාගැනීම තක්සේරුවේ දී සිදු වේ. මුල දී තීරණය කර ගත් නිර්ණායක සමග සසඳා බලමින් අදාළ නිපුණතා කවර මට්ටමකින් ශිෂ්‍යයා සාක්ෂාත් කරගෙන තිබේ දැ යි පරීක්ෂා කළ යුතු ය. ඒ අනුව ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ සහ ඉදිරි පෝෂණ වැඩ සටහන් සංවිධාන කළ යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේෂණය, ශිෂ්‍ය ක්‍රියාකාරකම්, ඉදිරිපත් කිරීම යන අවස්ථාවල තක්සේරු කාර්යය මැනවින් කළ හැකි ය.

තක්සේරු කාර්යයට අමතර ව ඇගයීම් වැඩපිළිවෙළ යනු ශිෂ්‍යයා ගේ ප්‍රවීණතා මට්ටම තීරණය කිරීම ය. ප්‍රවීණතා මට්ටම විනිශ්චයේ දී සිසුන් හිමි කර ගත් ශ්‍රේණි, ලකුණු ආදිය සසඳා ඔවුන් ගේ ප්‍රගතිය සොයා බැලිය යුතු ය.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

ශ්‍රී ලංකාව තුළ සංස්කෘත භාෂාව දිගු කලක පටන් පරපුරෙන් පරපුරට පැවත එයි. ජේතවනාරාම සංස්කෘත සෙල් ලිපිය නමින් ප්‍රකට ව ඇති අභයගිරි සංස්කෘත සෙල් ලිපිය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන්නේ ශ්‍රී ලාංකික ජන සමාජය තුළ සංස්කෘත භාෂාව සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ද භාවිත වූ බව යි. සිංහල භාෂා-සාහිත්‍යය වෙත සුවිශාල ආභාසයක් සපයා ඇති සංස්කෘතය දෙමළ භාෂා-සාහිත්‍යය වෙත ද එබඳු ම ආභාසයක් සපයා ඇත. '**සර්වභාෂාසු යා ශ්‍රේෂ්ඨා**' ආදි හැඳින්වීම්වලට අනුව සංස්කෘතය සියලු භාෂාවන් අතර ශ්‍රේෂ්ඨතම වූත්, සියලු ශාස්ත්‍ර සමූහයන් ගෙන් ආඪ්‍ය වූත්, අංග සම්පූර්ණ භාෂාවකි. සිංහල හෝ දෙමළ මවුබස කොට ඇති ශිෂ්‍යයාට ඊට වෙනස් වූ අක්ෂර රටාවක් වෙත යොමු වෙමින් හෝඩිය වශයෙන් ඉඳුරා වෙනස් නො වුව ද විෂමතා හඳුනාගනිමින් හැදෑරිය යුතු සංස්කෘතය ශිෂ්‍යයන් අතර ප්‍රියශීලි විෂයයක් බවට පත් කිරීමටත්, එම විෂය ඉගැනීම සඳහා ඔවුන් පෙළඹවීමටත්, භාෂාව පහසුවෙන් ඉගෙනීමේ සාම්ප්‍රදායික විධි ක්‍රම නො ඉක්මවමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සකස් කළ යුතු ය. එ විට පෙරට වඩා සංස්කෘත භාෂාව ජනප්‍රිය කළ හැකි ය. ඒ සඳහා තුලනාත්මක භාෂා අධ්‍යයන විධි ක්‍රමය වඩාත් උචිත වනු ඇත.

නිපුණතා පාදක අධ්‍යාපනය ජාතික අවශ්‍යතාවක් වන බැවින් සංස්කෘත භාෂාවෙන් පෙරටත් වඩා නිපුණයන් බිහි කිරීම අරමුණු කොට ගවේෂණාත්මක ක්‍රියාකාරකම් ඔස්සේ සිසු නිපුණතා ගොඩනැගෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කෙරේ.

අතීතයේ සිට පන්ති කාමර තුළ බහුල ව ක්‍රියාත්මක වූ ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රම වූ සම්ප්‍රේෂණ ක්‍රමය (Transmisson Role), ගනුදෙනු ක්‍රමය (Transaction Role), ඉක්මවා සිසු චින්තනය අවදි කරන, සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කරන පරිණාමන ක්‍රමය (Transformation Role) ගුරුවරයා අනුගමනය කරනු ඇතැ යි මෙහි දී අපේක්ෂා කෙරේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යය ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයකු ම ඒ ඒ නිපුණතා සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත්දායකයකු ගේ තත්ත්වය පරිණාමන ගුරු භූමිකාවේ කැපී පෙනෙන ලක්ෂණයකි. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් උගන්නා අයුරු සමීප ව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නො හැකියා හඳුනාගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැර ව ඉගෙනුම් හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ.

සංස්කෘත විෂයය සමස්ත පිරිවෙන් පද්ධතියේ ප්‍රධාන සහ අනිවාර්ය භාෂා විෂයයක් වන බැවින් භාෂාවන් ඉගෙනීමේ දී භාවිත කළ හැකි නූතන විද්‍යාත්මක ක්‍රම, එනම් ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය, සමකාලීන ප්‍රකාශන, අන්තර්ජාලය ආදිය ද භාෂා භාවිතයට කෙටි විද්‍යාත්මක ක්‍රම හා තර්කානුකූල ක්‍රම ද යොදා ගත යුතු ය.

# පාඩම 1 - දේවනාගරී අක්ෂරමාලාව

**නිපුණතාව** : 1.0 දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.1 දේවනාගරී අක්ෂරමාලාව කියවයි; ලියයි.

**කාලච්ඡේද** : 16 යි

**ඉගෙනුම් පල** :

- දේවනාගරී හෝඩිය හඬ නගා කියවයි.
- සිංහල හෝඩියේ සහ දේවනාගරී හෝඩියේ අක්ෂරරූප සංසන්දනය කරයි.
- සිංහල හෝඩියේ සහ දේවනාගරී හෝඩියේ උච්චාරණයේ ඇති වෙනස සංසන්දනය කරයි.
- දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර කියවයි; ලියයි.
- දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර කියවයි; ලියයි.
- අකුරු ලියැවෙන නිවැරදි අනුක්‍රමය අනුගමනය කරමින් සියලු අක්ෂර ලියා දක්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- දේවනාගරී හෝඩිය ඉතා පහසුවෙන් ඉගෙන ගත හැකි බව සහ එහි වටිනාකම (හින්දි, උර්දු, වැනි වෙනත් භාෂා කියවිය හැකි බව) සිසුන්ට පහදා දෙන්න.
- ඇමුණුම - 1 හි පරිදි සකසා ගත් දේවනාගරී අක්ෂර හා සිංහල අක්ෂර ඇතුළත් පුවරුව සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- පුවරුව ඇසුරෙන් සිංහල අක්ෂරමාලාවේ ඇති, දේවනාගරී අක්ෂරමාලාවේ නැති අක්ෂර පිළිබඳ වෙනස ගැන සිසු අවධානය යොමු කරන්න.
- ඇමුණුම - 2 ට අදාළ කාඩ්පත් සිසුන්ට සුදුසු පරිදි බෙදා දෙන්න.
- ගුරු භවතා අක්ෂර කියවන විට ඊට අදාළ දේවනාගරී සහ සිංහල අක්ෂර අඩංගු කාඩ්පත් ඉදිරිපත් කිරීමට සිසුන් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

කාලච්ඡේද සුදුසු පරිදි පහත තේමා යටතේ වෙන් කර ගන්න.

- අ (अ) සිට ඌ (ऊ) දක්වා ස්වර
- ඍ (ऋ) සිට ඕ (ओ) දක්වා ස්වර
- ක (क) සිට ඞ (ङ) දක්වා ව්‍යඤ්ජන (කවර්ගාක්ෂර)
- ච (च) සිට ඤ (ञ) දක්වා ව්‍යඤ්ජන (චවර්ගාක්ෂර)
- ට ( ट) සිට ණ (ण) දක්වා ව්‍යඤ්ජන (ටවර්ගාක්ෂර)
- ත (त) සිට න (न) දක්වා ව්‍යඤ්ජන (තවර්ගාක්ෂර)
- ප (प) සිට ම (म) දක්වා ව්‍යඤ්ජන (පවර්ගාක්ෂර)
- ය (य) සිට ව (व) දක්වා ව්‍යඤ්ජන (අන්තඃස්ථාක්ෂර)
- ශ (स) සිට හ (ह) දක්වා ව්‍යඤ්ජන (ඌෂ්මාක්ෂර) සහ අං (अं), අඃ (अः) දෙක

පියවර 2

- ඇමුණුම - 1 යොදා ගනිමින් නියමිත දිනට අදාළ අක්ෂර සිසුන් ලවා ශබ්ද නගා කියවන්න.
- තනිතනිවත්, සාමූහිකවත් පුනරුච්චාරණය කරමින් සිංහල සහ දේවනාගරී අක්ෂරවල උච්චාරණය ඉස්මතු කර පෙන්වන්න.
- නිවැරදි අනුක්‍රමයට අනුව එම අකුරු ලියන පිළිවෙළ හුණු පුවරුවේ ඉතා සෙමින් ලියා පෙන්වන්න.
- සිසුන් හුණු පුවරුවට කැඳවා නැවත ඔවුන් ලවා ද එම අක්ෂර ලියවන්න.
- නිවැරදි අනුක්‍රමයට අනුව අකුරු ලියැවෙන පිළිවෙළ සංස්කෘත භාෂාව - පළමු ශ්‍රේණියේ 10, 25, 26 පිටු ඇසුරෙන් සියලු අක්ෂර සිසුන් ලවා පිටපත් කරවන්න.
- ඇමුණුම - 2 ට අනුව සාදාගත් අක්ෂර කුට්ටම් යොදා ගනිමින් සිංහල/දේවනාගරී මතකයෙන් ගැළපිය හැකි ක්‍රියාකාරකමක් පවත්වන්න.
- පෙළපොතේ අදාළ අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරන්න.
- පිලි රහිත සරල සංස්කෘත වචන කිහිපයක් හුණු පුවරුවේ ලියා පෙන්වන්න.
- වචන ලිවීමේ දී සංස්කෘත අක්ෂරවල මූලික කොටස් පළමුව ලියා උඩ හරස් ඉර පසුව ලියැවෙන බව පෙන්වා දෙන්න.
- ඒ අනුව එවැනි පිලි රහිත වචන කියවන විට, හුණුපුවරුවේ නිවැරදි ව ලිවීමට හැකිදැයි සොයා බලන්න.
- සංස්කෘත භාෂාව - පළමු ශ්‍රේණියේ  03 පාඩමට අදාළ සියලු අභ්‍යාස එකින් එක සිසුන් ලවා කරවන්න.
- අභ්‍යාසවල නිවැරදි බව පරීක්ෂා කර ලකුණු ලබා දී අගයන්න.
- ව්‍යවහාරයේ පවතින සිසුන් දන්නා සරල වචන දේවනාගරී අක්ෂරයෙන් ලිවීමට යොමු කරවන්න. (උදා:- අමර, කමල, නගර, වචන)
- ඇමුණුම 3 අභ්‍යාසයෙහි සිසුන් නිරත කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ස්වර හා ව්‍යඤ්ජන වශයෙන් සංස්කෘත හෝඩිය වර්ග කර දැක්වීම
- ස්වර දාහතර වෙන් වෙන් ව ශබ්ද නගා උච්චාරණය කිරීම
- ව්‍යඤ්ජනාක්ෂර තිස්පහ වෙන් වෙන් ව ශබ්ද නගා උච්චාරණය කිරීම
- නිවැරදි පියවර අනුගමනය කරමින් සියලු ම අක්ෂර ලිවීම
- පිලි රහිත වචන නිවැරදි ව ලිවීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම් - 1, 2, හා 3
- සංස්කෘත භාෂාව - පළමුවන ශ්‍රේණිය, පෙළපොත
- හුණු පුවරුව

ගුරුවරයාගේ පරිශීලනයට :

- සරල සංස්කෘත ශික්ෂකය 1 පොත (බළන්ගොඩ ආනන්ද මෛත්‍රේය නාහිමි)

ශිෂ්‍යයාගේ පරිශීලනයට :

- සංස්කෘත අකුරු ලියමු (1) පොත (ප්‍රාචී අධ්‍යාපන ආයතනය)
- සංස්කෘත අක්ෂර ලියන ආකාරය දැක්වෙන DVD තැටිය (ප්‍රාචී අධ්‍යාපන ආයතනය)

ඇමුණුම 1

**स्वराक्षराणि** - ස්වරාක්ෂර මාලාව

| සංස්කෘත | अ | आ | - | - | इ | ई | उ | ऊ | ऋ | ॠ | ऌ | ॡ | ए | - | ऐ | ओ | - | औ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සිංහල | අ | ආ | ඇ | ඈ | ඉ | ඊ | උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ | එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |


**व्यञ्जनाक्षराणि** - ව්‍යඤ්ජනාක්ෂර මාලාව

| | වර්ගාක්ෂර 1 (ක වර්ගය) | | | | | වර්ගාක්ෂර 2 (ච වර්ගය) | | | | | වර්ගාක්ෂර 3 (ට වර්ගය) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සංස්කෘත | क | ख | ग | घ | ङ | च | छ | ज | झ | ञ | ट | ठ | ड | ढ | ण |
| සිංහල | ක | ඛ | ග | ඝ | ඞ | ච | ඡ | ජ | ඣ | ඤ | ට | ඨ | ඩ | ඪ | ණ |

| | වර්ගාක්ෂර 4 (ත වර්ගය) | | | | | වර්ගාක්ෂර 5 (ප වර්ගය) | | | | | අන්තඃස්ථාක්ෂර | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සංස්කෘත | त | थ | द | ध | न | प | फ | ब | भ | म | य | र | ल | व | - |
| සිංහල | ත | ථ | ද | ධ | න | ප | ඵ | බ | භ | ම | ය | ර | ල | ව | ළ |

| | ඌෂ්මාක්ෂර | | | | අනුස්වාරය හා විසර්ගය | | | | | සඤ්ඤක අකුරු | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සංස්කෘත | श | ष | स | ह | अं | अः | - | - | - | - | - | - | - | - |
| සිංහල | ශ | ෂ | ස | හ | අං | අඃ | - | - | - | ඟ | ඦ | ඬ | ඳ | ඹ |

ඇමුණුම 2




නිදසුනකි.

සංස්කෘත අක්ෂර සහ ඊට අදාළ සිංහල අකුරු ද 3" x 3" ප්‍රමාණයේ කාඩ්පත්වල තනි පැත්තේ ඉහත ක්‍රමයට සකසා ගන්න.

ඇමුණුම 3

පහත සඳහන් නාගරී අකුරු සිංහල අකුරින් ලියන්න.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| इ | आ | ई | ख | औ | ग | घ | ऊ | ॠ | ढ |
| अ | ऋ | उ | ह | ए | ओ | च | छ | ठ | थ |
| ऐ | क | ङ | ज | ट | ड | ण | त | द | भ |
| झ | ञ | ध | न | प | फ | ब | म | स | ष |

# පාඩම 2 - ව්‍යඤ්ජනාක්ෂර

**නිපුණතාව** : 1.0 දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.1 පිලි සහිත දේවනාගරී අක්ෂර කියවයි; ලියයි.

1.2 දේවනාගරී අක්ෂරවලින් සඳහන් ව්‍යවහාරයේ පවතින සරල සංස්කෘත වචන කියවයි; ලියයි.

**කාලච්ඡේද** : 10 යි

**ඉගෙනුම් පල** :

- ව්‍යඤ්ජනාක්ෂරවලට ස්වරාක්ෂර එකතු වී ඇති ආකාරය වියුක්ත කර පෙන්වයි.
- ස්වරාරෝපණයේ දී ව්‍යඤ්ජනාක්ෂරවල ඇති වන විශේෂතා ඉස්මතු කර පෙන්වයි.
- ව්‍යඤ්ජනයකට ස්වර ආරෝපණය කොට පිලි යොදා පෙන්වයි.
- පිලි යෙදුණු අකුරු නිවැරදි ව කියවයි; ලියයි.
- පිලි රහිත සරල සංස්කෘත වචන ලියා පෙන්වයි.
- පිලි සහිත සරල සංස්කෘත වචන ලියා පෙන්වයි.
- පිලි සහිත සරල සංස්කෘත වචනවල ස්වර සහ ව්‍යඤ්ජන වෙන්කොට දක්වයි.
- විවිධ සුලබ වචන ඇතුළත් සරල සංස්කෘත ඡේද කියවයි; ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- සිංහල ව්‍යඤ්ජනාක්ෂරයකට ස්වර අරෝපණය වී පිලි සෑදෙන අයුරු හුණු පුවරුවේ ලියා පෙන්වමින් හා (ඉස්පිල්ල, පාපිල්ල ආදි) ඒ ඒ පිල්ලම් නැවත සිහි කැඳවමින් ඒ පිළිබඳ සිසුන් ගෙන් විමසන්න.
- දේවනාගරී ව්‍යඤ්ජන අක්ෂරයකට ස්වර අක්ෂර සියල්ල ආරෝපණය වී පිලි සෑදෙන අයුරු පහදා දෙමින් සංස්කෘත භාෂාව - පළමු වන ශ්‍රේණිය පෙළපොතේ 33, 34 පිටුවල දැක්වෙන සංවාදයට හා වගුවට සිසු අවධානය යොමු කරන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- ව්‍යඤ්ජනයක් යනු තනි ව උච්චාරණය කළ නොහැකි අකුරු බව මුලින් ම පෙන්වා දෙන්න.
- පෙළ පොතේ 34 පිටුව ඇසුරෙන් क् යන්නට ස්වර 14 යෙදී පිලි අකුරු සෑදෙන අයුරු පෙන්වා දෙන්න.
- එම පිලි සහිත අකුරු සිසුන් සමග වාර ගණනාවක් සාමූහික ව හඬ නගා උච්චාරණය කරවන්න.
- එම පිලි සහිත අක්ෂර අභ්‍යාස පොත්වල ලිවීමට අවස්ථාව දෙන්න.
- र् හට उ ස්වරය ආරෝපණය වීමේ දී रु, रू දෙකේ පිලි පිළිබඳ සිසුන්ගේ අවධානය යොමු කරවන්න.
- द्, ह् ව්‍යඤ්ජනයන්ට ऋ ස්වරය ආරෝපණය වීමේ දී दृ, हृ යෙදෙන පිල්ලමේ ඇති විශේෂතා ව පෙන්වා දෙන්න.

- පෙළපොතේ 4 පාඩමේ 4.1, 4.2 අභ්‍යාස කරවන්න.
- අභ්‍යාසවල නිරවද්‍යතා ව පරීක්‍ෂාවට ලක් කරන්න.
- ඇමුණුම - 1 ඇසුරෙන් පිලි නියෝජනය වන ස්වර පෙන්වා දෙන්න.
- වෙනත් ව්‍යඤ්ජන යොදා ගනිමින් ඇමුණුම - 1 ආකාරයේ අභ්‍යාස කරවන්න.
- ඒවා ඔවුන් අතර හුවමාරු කර, නිවැරදි කරවන්න.

පියවර 2

- ව්‍යවහාරයේ පවතින පිලි සහිත සරල වචන කිහිපයක් හුණු පුවරුවේ ලියා පෙන්වන්න.
- පළමු ව අක්‍ෂරවල මූලික කොටස් ලියා දෙවනු ව හරස් ඉර යෙදීමෙන් වචන සම්පූර්ණ කරන නිවැරදි පියවර (පිළිවෙළ) පිළිබඳ සිසුන්ගේ අවධානය යොමු කරන්න.
- අහඹු ලෙස සිසුවකු හෝ දෙදෙනකු නම් කර එම පිළිවෙළට වචන කිහිපයක් හුණු පුවරුවේ ලියා පෙන්වන ලෙස දන්වන්න.
- පිලි සහිත සරල වචන ඇතුළත් පෙළ පොතේ 4.5 සහ 4.6 අභ්‍යාස සිසුන් ලවා කරවන්න.

පියවර 3

- අඟල් 3X 6 ප්‍රමාණයේ කාඩ්පත් 30 ක් සකසා ගන්න.
- ඇමුණුම 2 හි දැක්වෙන පරිදි පිලි සහිත සරල වචන කාඩ්පත්වල සිසුන් ලවා ලියවන්න.
- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා සකසාගත් කාඩ්පත්වල ඇති වචන කියැවීමට සලස්වන්න.
- නිවැරදි ව කියැවූ සිසුන් ඇගයීමට ලක් කරන්න.
- පිලි සහිත සරල වචන කිහිපයක් යොදාගෙන ස්වර සහ ව්‍යඤ්ජන වෙන්කොට පෙන්වන්න.
- සිසුන් හුණු පුවරුවට කැඳවමින් එම ක්‍රියාකාරකමේ තනි තනි ව නිරත කරවන්න.
- පිලි සහිත සරල සංස්කෘත වචනවල ස්වර සහ ව්‍යඤ්ජන වෙන්කොට දැක්වීමේ අභ්‍යාසවල යොද වන්න.
- ඇමුණුම 3 අභ්‍යාසයෙහි සිසුන් නිරත කරවන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය :**

- ව්‍යඤ්ජනයකට ස්වර සියල්ල ආරෝපණය කොට දැක්වීම
- ගුරුවරයා හුණුපුවරුවේ පිලි සහිත වචන ලියා දක්වන විට නිවැරදි ව හඬ නගා කියැවීම
- කියවන විට ලිවීමේ දී නිවැරදි ව පිලි භාවිත කිරීම
- පිලි සහිත ඕනෑ ම සරල වචනයක ස්වර ව්‍යඤ්ජන වියුක්ත කොට පෙන්වීම

**ගුණාත්මක යෙදවුම් :**

- සංස්කෘත භාෂාව - පළමුවන ශ්‍රේණිය, පෙළපොත
- ඇමුණුම - 1, 2 සහ 3
- හුණු පුවරුව

**ශිෂ්‍යයාගේ පරිශීලනයට :**

- සංස්කෘත අකුරු ලියමු - 1 පොත (ප්‍රාචී අධ්‍යාපන ආයතනය)

ඇමුණුම - 1

| | | | |
|---|---|---|---|
| 1. | (අ) | अ | मी |
| 2. | (ආ) | आ | मु |
| 3. | (ඉ) | इ | मौ |
| 4. | (ඊ) | ई | मृ |
| 5. | (උ) | उ | म |
| 6. | (ඌ) | ऊ | मा |
| 7. | (ඍ) | ऋ | मि |
| 8. | (ඎ) | ॠ | मै |
| 9. | (එ) | ए | मो |
| 10. | (ඓ) | ऐ | मू |
| 11. | (ඔ) | ओ | मे |
| 12. | (ඖ) | औ | मॄ |

ඇමුණුම - 2

| | | | |
|---|---|---|---|
| आकाश | नासिका | नीतिपीठ | तिमिर |
| पुनरुदय | पूजावली | कृपण | कृकार |
| केदार | नैतिक | कोमल | कौमुदी |

පිලි අකුරු සහිත මෙවැනි සරල වචන ඇතුළත් කාඩ්පත් 30 ක් පමණ සාදා ගන්න.

පහත නිදසුන ඇසුරින් වගුව සම්පූර්ණ කරන්න.

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| क | का | कि | की | कु | कू | कृ | कॄ | के | कै | को | कौ |
| ක | කා | කි | කී | කු | කූ | කෘ | කෲ | කෙ | කෛ | කො | කෞ |
| च | | | ची | | | | | चे | | | |
| ච | | | චී | | | | | චෙ | | | |
| ड | | | | | डू | | | | | | डौ |
| ඩ | | | | | ඩූ | | | | | | ඩෞ |
| त | ता | | | | | तृ | | | | | |
| ත | තා | | | | | තෘ | | | | | |
| म | | | मि | | | | | | मै | | |
| ම | | | මි | | | | | | මෛ | | |
| स | | | | | सु | | | | | सो | |
| ස | | | | | සු | | | | | සො | |

# පාඩම 3 - දේවනාගරී සංයුක්තාක්ෂර

**නිපුණතාව** : 1.0 දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.2 පිලි සහිත දේවනාගරී අක්ෂර සහ දේවනාගරී සංයුක්තාක්ෂර කියවයි; ලියයි.

1.3 දේවනාගරී අක්ෂරවලින් සඳහන් ව්‍යවහාරයේ පවතින සරල සංස්කෘත වචන කියවයි; ලියයි.

**කාලච්ඡේද** : 12 යි

**ඉගෙනුම් පල** :

- ව්‍යඤ්ජන අකුරු දෙකක් හෝ ඊට වැඩි ගණනක් එකතුව සංයුක්තාක්ෂර සෑදෙන බව පෙන්වා දෙයි.
- සංයුක්තාක්ෂර වර්ග කිහිපයක් ඇති බව හඳුන්වා දෙයි.
- සරල සංයුක්තාක්ෂර කියවයි; ලියයි.
- විශේෂ සංයුක්තාක්ෂර කියවයි; ලියයි.
- පිලි සහිත දේවනාගරී සංයුක්තාක්ෂර කියවයි; ලියයි.
- සංයුක්තාක්ෂර ඇති සරල වචන කියවයි; ලියයි.
- පිලි සහිත සංයුක්තාක්ෂර ඇති සරල වචන කියවයි; ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- ඇමුණුම - 1 හි සඳහන් පරිදි සිංහල හා සංස්කෘත සංයුක්තාක්ෂර හුණු පුවරුවේ ලියා දක්වන්න.
- ඒ අනුව ස්වර රහිත ව්‍යඤ්ජනාක්ෂරයක් තවත් ව්‍යඤ්ජනයක් සමග යෙදෙන විට ඒවා සංයුක්ත වන බව සිංහල අකුරු හා ඊට අනුරූපී සංස්කෘත අකුරු ඇසුරෙන් පෙන්වා දෙන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- සියලු ව්‍යඤ්ජනාක්ෂර අතරින් **म**, **स** වැනි දකුණු පසින් සිරස්ව ඉර විහිදෙන අකුරු මොනවාදැයි සිසුන්ගෙන් අසා හුණු පුවරුවේ වෙන් කර දක්වන්න.
- **म**, **स** වැනි අකුරු තවත් එවැනි ම අකුරකට සංයුක්ත වන විට මුල් අකුරේ දකුණු පසින් ඇති සිරස් ඉර ඉවත් වෙමින් සංයුක්ත වන ආකාරය පෙන්වා දෙන්න.
- ඇමුණුම 2 හි - I කොටස ඇසුරෙන් එවැනි සංයුක්ත අකුරු කිහිපයක් හුණු පුවරුවේ ලියා පෙන්වන්න.
- ඒවා නැවත නැවතත් සිසුන් ලවා කියවන්න.
- ඇමුණුම 2 හි - I - කොටසෙහි ඇති ඊට අදාළ අභ්‍යාසය කරවන්න.

පියවර 2

- ඇමුණුම 2 හි II කොටස ඇසුරෙන් क, ङ වැනි දකුණු පසින් සිරස් ව ඉර නොවිහිදෙන අකුරු පෙන්වා දෙන්න.
- එවැනි අකුරක් වෙනත් ඕනෑ ම අකුරක් සමග සංයුක්ත වන විට මුල් ව්‍යඤ්ජනය උඩටත්, ඊළඟ අකුර යටටත් වන සේ සිරස් අතට බැඳෙන අයුරු පෙන්වා දෙන්න.
- ඇමුණුම 2, II කොටසෙහි ඇතුළත් සිරස් අතට බැඳෙන එවැනි සංයුක්තාක්ෂර කිහිපයක් හුණු පුවරුවේ ලියා පෙන්වන්න.
- ඒවා කිහිප විටක් කියැවීමට සිසුන් යොමු කරවන්න.
- ඇමුණුම 2, II කොටසෙහි ඊට අදාළ අභ්‍යාසය කරවන්න.

පියවර 3

- ඇමුණුම 3 ඇසුරෙන් සිංහල අකුර සමග සසඳමින් ර් - र् යන්න වෙනත් ව්‍යඤ්ජනයක් හා බැඳෙන විට ඇති වන වෙනස හුණු පුවරුවේ ලියා පෙන්වන්න.
- එම අකුරු කිහිප විටක් සිසුන් සමග කියවන්න.
- ඇමුණුම 3 ඇසුරෙන් ව්‍යඤ්ජනයක් සමග (ර) र සම්බන්ධවීමේ දී ඇති වන සංයුක්තාක්ෂර පිළිබඳ සාකච්ඡා කරන්න.
- රේඵය හා රකාරාංශය යෙදෙන වචන ලිවීමට සිසුන් යොමු කරන්න.
- ඇමුණුම 4 ඇසුරෙන් එකතු වීමේ දී විශේෂ රූප ගන්නා සංයුක්තාක්ෂර ද ඇති බව පෙන්වා දෙන්න.
- එබඳු සංයුක්තාක්ෂර කිහිපයක් (त्त / ज्ञ / क्ष) හුණු පුවරුවේ ලියා පෙන්වන්න.
- ඇමුණුම 4 හි ඇති විශේෂ සංයුක්තාක්ෂර සිසුන්ට ලිවීමට හා කියැවීමට පුහුණු කරවන්න.

පියවර 4

- පිලි සහිත සංයුක්තාක්ෂර ද ඇති බව පෙන්වා දෙන්න.
- ඇමුණුම 5 ආශ්‍රයෙන් පිලි සහිත සංයුක්තාක්ෂර හුණු පුවරුවේ ලියා සිසුන් සමග කියවන්න.
- එවැනි සංයුක්තාක්ෂර සිසුන් ලවා අභ්‍යාස කරවන්න.
- පෙළපොතෙහි 5.1/5.2 අභ්‍යාස සිසුන් ලවා කරවන්න.
- අවට පරිසරයේ ඇති ව්‍යවහාරයේ පවතින තවත් පිලි සහිත සංයුක්තාක්ෂර ඇතුළත් වචන සිසුන් ලවා එකතු කරවන්න. (උදා: - විහාරමන්දිර, ධර්මශාලා, පුස්තකාල, චෛත්‍ය, ගර්භ)
- ඒවා දේවනාගරී අක්ෂරයෙන් අභ්‍යාස පොත්වල ලියවන්න.
- ඇමුණුම 6 අභ්‍යාසයෙහි සිසුන් නිරත කරවන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය :**

- සංයුක්තවීම යනු කුමක් දැයි පැහැදිලි කිරීම
- සංයුක්තාක්ෂර වර්ග පෙන්වමින් නිදසුන් දැක්වීම
- සිංහලෙන් දෙන ලද ඕනෑ ම සංයුක්තාක්ෂරයක් දේවනාගරී අකුරෙන් ලිවීම
- සංයුක්තාක්ෂර සහිත ව්‍යවහාරයේ පවතින වචන ඇතුළත් ඕනෑ ම ඡේදයක් කියැවීම
- සංයුක්තාක්ෂර සහිත වචන කියවන විට නිවැරදි ව ලිවීම
- සංයුක්තාක්ෂර සහිත ඕනෑ ම වචනයක් නිවැරදි ව වියුක්ත කර දැක්වීම

**ගුණාත්මක යෙදවුම් :**

- සංස්කෘත භාෂාව - පළමුවන ශ්‍රේණිය, පෙළපොත
- ඇමුණුම - 1, 2, 3, 4, 5 සහ 6
- හුණු පුවරුව

**ඇමුණුම 1**

**ස්වර රහිත ව්‍යඤ්ජනයක් තවත් ව්‍යඤ්ජනයක් සමග සංයුක්ත වීම**

| | | | |
|---|---|---|---|
| ග් + ග = ග්‍ග | ම් + ම = ම්‍ම | න් + ත = න්‍ත | ස් + ව = ස්‍ව |
| ग् + ग = ग्ग | म् + म = म्म | न् + त = न्त | स् + व = स्व |

**ඇමුණුම 2**

I - **කොටස**

**දකුණු පසින් සිරස් ඉරක් විහිදෙන අකුරු එවැනි ම තවත් අකුරකට සංයුක්ත වීම**

ख ग घ
च ज झ ञ ण
त थ ध न
प ब भ म
श ष स

තිරස් අතට බැඳෙන අකුරු

क्य ग्ज ज्य
न्म म्ब ल्व
स्व ष्म भ्य
ब्द ध्व म्प

**අභ්‍යාසය**

| | |
|---|---|
| 1. ත්‍ත - ............ | 1. च्च - ............ |
| 2. ප්‍ප - ............ | 2. स्स - ............ |
| 3. ග්‍ය - ............ | 3. श्व - ............ |
| 4. ප්‍ය - ............ | 4. त्य - ............ |
| 5. ත්‍ථ - ............ | 5. ज्ज - ............ |

II - කොටස

**දකුණු පසින් සිරස් ඉරක් නො විහිදෙන අකුරු වෙනත් අකුරු සමග සංයුක්ත වීම**

क ङ छ
ट ठ ड ढ
द ल ह

සිරස් අතට බැඳෙන අකුරු

क्क ङ्क ङ्ग
ङ्ख ट्ट ड्ड
द्ध द्द द्भ
ह्ल ह्न ह्ण

**අභ්‍යාසය**

1. ඩඩ - ............
2. ඩඪ - ............
3. ඞක - ............
4. දව - ............
5. ලල - ............

1. ट्ट - ............
2. क्क - ............
3. ड्ड - ............
4. ङ्ग - ............
5. द्ध - ............

ඇමුණුම 3

I - 'ර්' සමග ස්වර සහිත ව්‍යඤ්ජනයක් සංයුක්ත වීම

र् + क = र्क
र् + थ = र्थ
र् + घ = र्घ
र् + ग = र्ग

රේඵය

ර් + ක = ර්ක
ර් + ථ = ර්ථ
ර් + ධ = ර්ධ
ර් + ග = ර්ග

→ රේඵය

II - ව්‍යඤ්ජනයක් සමග 'ර' සංයුක්ත වීම

क् + र् + अ = क्र
ग् + र् + अ = ग्र
ट् + र् + अ = ट्र

රකාරාංශය

ක් + ර් + අ = ක්‍ර
ග් + ර් + අ = ග්‍ර
ට + ර් + අ = ට්‍ර

→ රකාරාංශය

ඇමුණුම 4

**එකතුවීමේ දී විශේෂ රූප ගන්නා සංයුක්තාක්‍ෂර**

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **क्त** | **क्र** | **क्ष** | **ज्ञ** | **त्त** | **त्र** | **द्म** | **द्य** | **श्च** | **श्न** | **श्र** | **श्व** | **स्त्र** |
| කත | කත්‍ර | ක්‍ෂ | ඥ | තත | ත්‍ර | දම | දය | ශච | ශන | ශ්‍ර | ශව | සත්‍ර |

ඇමුණුම 5

**පිලි සහිත සංයුක්තාක්‍ෂර**

| | |
|---|---|
| න් + ති = නති<br>न् + ति = न्ति | ක් + ෂ් + මී = ක්‍ෂමී<br>क् + ष् + मी = क्ष्मी |
| ඞ් + ගි = ඞගි<br>ङ् + गि = ङ्गि | න් + ත් + යු = නත්‍යු<br>न् + त् + यु = न्त्यु |
| ඌ + ර් + මි = ඌර්මි<br>ऊ + र् + मि = ऊर्मि | උ + ර් + වී = උර්වී<br>उ + र् + वी = उर्वी |

ඇමුණුම 6

**පහත සඳහන් සංස්කෘත වචන සිංහල අකුරින් ලියන්න.**

| | | | |
|---|---|---|---|
| नमति | ........................ | वानरे | ........................ |
| वृषभ | ........................ | कुमारौ | ........................ |
| जयति | ........................ | सूदानाम् | ........................ |
| आभरण | ........................ | औरस | ........................ |
| निपुण | ........................ | प्रधान | ........................ |
| संग्राम | ........................ | नीहार | ........................ |
| मार्जार | ........................ | पृथुल | ........................ |
| इच्छति | ........................ | उपदेश | ........................ |
| पण्डित | ........................ | नैतिक | ........................ |
| रात्रौ | ........................ | औषध | ........................ |

**පහත සඳහන් සිංහල වචන දේවනාගරී අකුරින් ලියන්න.**

| | | | |
|---|---|---|---|
| දුරිත | ........................ | ආගමන | ........................ |
| ආවරණ | ........................ | ධවල | ........................ |
| අඛිල | ........................ | ඌන | ........................ |
| ආයෝජන | ........................ | ඉහලෝක | ........................ |
| භාෂණ | ........................ | කන්දුකඃ | ........................ |
| අජගර | ........................ | ජනනී | ........................ |
| අජාඃ | ........................ | ආකාශ | ........................ |
| අජර | ........................ | උපාසකෞ | ........................ |
| දෛව | ........................ | කෘෂීවලඃ | ........................ |

# පාඩම 4 - දේවනාගරී ඉලක්කම්

**නිපුණතාව** : 1.0 දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.4 දේවනාගරී ඉලක්කම් කියවයි, ලියයි.

**කාලච්ඡේද** : 04 යි

**ඉගෙනුම් පල** :

- 0 සිට 10 දක්වා දේවනාගරී ඉලක්කම් රූප කියවයි.
- 0 සිට 10 දක්වා දේවනාගරී ඉලක්කම් රූප ලියයි.
- 0 සිට 10 දක්වා දේවනාගරී ඉලක්කම් භාවිත කරමින් 100 දක්වා සංඛ්‍යා ගොඩනගයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- ඇමුණුම 1 හි මෙන් ව්‍යවහාර ඉලක්කම් (ඉන්දු - අරාබි ඉලක්කම්) හා දේවනාගරී ඉලක්කම් ලියන ලද පුවරුවක් ප්‍රදර්ශනය කරන්න.
- එම ඉලක්කම් ඒක, ද්වි, හා ත්‍රි ආදි වශයෙන් උච්චාරණය කරමින් සාමූහික ව කියැවීමට සිසුන් යොමු කරන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- ඇමුණුම 1 පුවරුව සිසුන්ට දර්ශනය වන සේ පන්ති කාමරය තුළ රඳවන්න.
- 0 සිට 10 දක්වා ඉලක්කම් එකින් එක නිවැරදි පියවර අනුගමනය කරමින් හුණු පුවරුවේ ලියා පෙන්වන්න.
- එම ඉලක්කම් හුණු පුවරුවේ ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එම ඉලක්කම් අභ්‍යාස පොත්වල ද පිටපත් කිරීමට යොමු කරන්න.

**පියවර 2**

- 0 සිට 10 දක්වා දේවනාගරී ඉලක්කම් භාවිත කරමින් 100 දක්වා සංඛ්‍යා ගොඩනගන අයුරු පෙන්වන්න.
- පෙළපොතේ 5.3 අභ්‍යාසය කරවන්න.
- 100 ට වඩා අඩු පිළිතුරු ලැබෙන (එකතු කිරීම, අඩු කිරීම වැනි) සරල ගණිතමය අභ්‍යාස කිහිපයක් කරවන්න.
- 0 සිට 10 දක්වා දේවනාගරී ඉලක්කම් (**एक, द्वि, त्रि**) වශයෙන් ඇමුණුම 1 ඇසුරෙන් සිසුන් සමග හඬ නගා කියවන්න.
- 0 සිට 10 දක්වා දේවනාගරී ඉලක්කම් යොදා ඇති අඟල් 4 X 4 ප්‍රමාණයේ කාඩ්පත් 10ක් සකසා ගන්න.
- එම කාඩ්පත් ඉදිරිපත් කරමින් අහඹු ලෙස නම් කරන ලද සිසුන්ගෙන් ඉලක්කම් නාමය කුමක් දැයි ප්‍රශ්න කරන්න

පියවර 3

- දිනපතා පන්තියට පැමිණ ඇති සිසුන් සංඛ්‍යාව හා අදාළ දිනය හුණු පුවරුවේ දකුණු ඉහළ කෙළවරේ සටහන් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- වර්ෂය, මාසය, දිනය ඇතුළත් ව සෑම පාඩමක දී ම අභ්‍යාස පොතේ දිනය ලියා දැක්වීමට සිසුන් මෙහෙයවන්න.
- ඇමුණුම 2 අභ්‍යාසයෙහි සිසුන් නිරත කරවන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය :**

- 1 සිට 10 දක්වා දේවනාගරී ඉලක්කම් නිවැරදි ව කියැවීම හා ලිවීම
- මාතෘභාෂාවේ ව්‍යාවහාරික ඉලක්කම් සමග සංස්කෘත ඉලක්කම් නිවැරදි ව ගැළපීම
- දිනයට අදාළ වර්ෂය, මාසය, දිනය සංස්කෘත ඉලක්කමින් හුණු පුවරුවේ, අභ්‍යාස පොත්වල ලිවීම
- පන්තියේ සිටින සිසුන් සංඛ්‍යාව සංස්කෘත ඉලක්කම්වලින් සටහන් කිරීම
- 100 දක්වා සංඛ්‍යාවලින් දේවනාගරී අක්ෂර භාවිත කරමින් සරල ගණිත අභ්‍යාස කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- සංස්කෘත භාෂාව - පළමුවන ශ්‍රේණිය, පෙළපොත
- ඇමුණුම - 1 සහ 2
- 0 සිට 10 දක්වා දේවනාගරී ඉලක්කම් යොදා ඇති අඟල් 4 X 4 කාඩ්පත් 10 ක්

**ශිෂ්‍යයාගේ පරිශීලනයට :**

- සරල සංස්කෘත ශික්ෂකය - 1 පොත (බලන්ගොඩ ආනන්ද මෛත්‍රේය නාහිමි)

ඇමුණුම 1

| ඉන්දු අරාබි ඉලක්කම් | දේවනාගරී ඉලක්කම් | ඉලක්කම් නාමය |
|---|---|---|
| 0 | 0 | शून्य |
| 1 | १ | एक |
| 2 | २ | द्वि |
| 3 | ३ | त्रि |
| 4 | ४ | चतुर् |
| 5 | ५ | पञ्चन् |
| 6 | ६ | षष् |
| 7 | ७ | सप्तन् |
| 8 | ८ | अष्टन् |
| 9 | ९ | नवन् |
| 10 | १० | दशन् |

ඇමුණුම 2

**පහත දැක්වෙන සංඛ්‍යා දේවනාගරී ඉලක්කමෙන් ලියන්න.**

| | | | |
|---|---|---|---|
| 23 | ............................ | 45 | ............................ |
| 167 | ............................ | 890 | ............................ |
| 2018 | ............................ | 4953 | ............................ |

**පහත දැක්වෙන සංඛ්‍යා ඉන්දු-අරාබි ඉලක්කමෙන් ලියන්න.**

| | | | |
|---|---|---|---|
| ३४ | ............................ | १२५ | ............................ |
| ६७३९ | ............................ | १०७८ | ............................ |
| १३४४ | ............................ | ९०८११ | ............................ |

# පාඩම 5 - නාමපද

**නිපුණතාව** : 2.0 සංස්කෘත භාෂාවේ නාමපද නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** :

2.1 සංස්කෘත භාෂාවේ තෝරාගත් නාම, ඒකවචන, ද්විවචන සහ බහුවචන ලෙස නිවැරදි ව වර්ග කරයි.

2.2 සංස්කෘත භාෂාවේ ලිඞ්ගභේදයට අනුකූල ව තෝරාගත් වචන වර්ග කරයි.

2.3 නාමවල ශබ්දමූලය වෙන් කරයි.

2.4 නාමයක් ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවලට අනුව වරනගයි.

2.5 නාමපද අතර සර්ව නාමපද වෙන් කර පෙන්වයි.

2.6 විභක්තිවලට අනුව නාම නිවැරදි ව වරනගයි.

**කාලච්ඡේද** : 20 යි

**ඉගෙනුම් පල** :

- මාතෘභාෂාවේ එදිනෙදා භාවිත කරන නාමපද ප්‍රකාශ කරයි.
- මාතෘභාෂාවේ එදිනෙදා භාවිත කරන නාමපද සංස්කෘත භාෂාවෙන් වාචික ව ප්‍රකාශ කරයි.
- මාතෘභාෂාවේ ඇති නාමපද ඒකවචන, ද්විවචන සහ බහුවචන ලෙස වර්ග කරමින් සංස්කෘත භාෂාවේ ඇති වචනත්‍රය සංසන්දනය කරයි.
- සංස්කෘත භාෂාවේ වචනත්‍රයට අනුව එදිනෙදා භාවිත කරන තෝරාගත් සංස්කෘත වචන වාචික ව වර්ග කර පෙන්වයි.
- එදිනෙදා භාවිත කරන සංස්කෘත වචන පුංලිඞ්ග, ස්ත්‍රීලිඞ්ග සහ නපුංසකලිඞ්ග වශයෙන් වාචික ව පෙළගස්වයි.
- දෙනු ලබන නාමපදයක ශබ්දමූලය ඉස්මතු කර පෙන්වයි.
- එදිනෙදා භාවිත කරන අකාරාන්ත පුංලිඞ්ග සහ නපුංසකලිඞ්ග නාම, ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවල වරනගයි.
- එදිනෙදා භාවිත කරන ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග නාම, ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවල වරනගයි.
- සර්වනාම යනු මොනවා දැයි නිදසුන් සහිත ව පහදයි.
- නාම විභක්ති නම් කරයි.
- නාම විභක්තිවල අර්ථය පහදයි.
- ස්වරයකින් අවසන් වන නාමපද ස්වරාන්ත ලෙස නම් කරයි.
- දෙනු ලබන විවිධ ස්වරාන්ත නාම අකාරාන්ත, ආකාරාන්ත, ඉකාරාන්ත සහ උකාරාන්ත ලෙස පෙළගස්වයි.
- අකාරාන්ත පුංලිඞ්ග **कुमार** ශබ්දය අනුපිළිවෙළට වරනගයි.
- ඉකාරාන්ත පුංලිඞ්ග **मुनि** ශබ්දය අනුපිළිවෙළට වරනගයි.
- උකාරාන්ත පුංලිඞ්ග **गुरु** ශබ්දය අනුපිළිවෙළට වරනගයි.
- අකාරාන්ත නපුංසකලිඞ්ග **फल** ශබ්දය අනුපිළිවෙළට වරනගයි.
- ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග **लता** ශබ්දය අනුපිළිවෙළට වරනගයි.

- අකාරාන්ත, ආකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත යන අන්ත අනුව නාම වරනැඟීමේ දී දැකිය හැකි වෙනස්කම් පැහැදිලි කරයි.
- ලිඞ්ගත්‍රයට අනුව නාම වරනැඟීමේ දී දැකිය හැකි වෙනස්කම් පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- පෙළ පොතේ 6 පාඩමේ 57 පිටුවේ තිබෙන 6.1 රූපය පෙන්වා එදිනෙදා භාවිත කරන සරල නාමපද කිහිපයක් ප්‍රකාශ කිරීමට සිසුන් යොමු කරන්න.
- එසේ ප්‍රකාශ කළ නාමපද සංස්කෘතයට පරිවර්තනය කරන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- සංස්කෘත භාෂාවේ ඒකවචන, ද්විවචන, බහුවචන වශයෙන් වචනත්‍රයක් ඇති බව පෙන්වා දෙන්න.
- සංස්කෘත භාෂාවේ ඇති පුංලිඞ්ග ශබ්දවල සිංහලාර්ථය පෙන්වා දෙන්න. (ඇමුණුම 1)
- එම අකාරාන්ත පුංලිඞ්ග ශබ්ද ප්‍රථමාවිභක්තියේ වරනැගෙන අයුරු පෙන්වා දෙන්න. (ඇමුණුම 2)
- සංස්කෘත භාෂාවේ ඇති ස්ත්‍රී ශබ්දවල සිංහලාර්ථය පෙන්වා දෙන්න. (ඇමුණුම 3)
- ඉහත ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග ශබ්ද ප්‍රථමාවිභක්තියේ වරනැගෙන අයුරු පෙන්වා දෙන්න. (ඇමුණුම 4)
- සංස්කෘත භාෂාවේ ඇති නපුංසකලිඞ්ග ශබ්දවල සිංහලාර්ථය පෙන්වා දෙන්න. (ඇමුණුම 5)
- ඉහත අකාරාන්ත නපුංසකලිඞ්ග ශබ්ද ප්‍රථමාවිභක්තියේ වරනැගෙන අයුරු පෙන්වා දෙන්න. (ඇමුණුම 6)

**පියවර 2**

- නාමපද කිහිපයක් ගෙන ඒවායේ නාමය ඉස්මතු කර පෙන්වා දෙන්න. (ඇමුණුම 7)
- එදිනෙදා භාවිත කරන අකාරාන්ත පුංලිඞ්ග සහ නපුංසකලිඞ්ග නාම, ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග නාම ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවල වරනැගෙන අයුරු පෙන්වා දෙන්න. (ඇමුණුම 8)
- ලිඞ්ගත්‍රයේ නාමපද වෙනුවට සර්ව නාමපද යෙදෙන ආකාරය පෙන්වා දෙන්න. (ඇමුණුම 9)

**පියවර 3**

- සංස්කෘත භාෂාවේ ප්‍රධාන විභක්ති හතක් ඇති බවත් සම්බෝධන හා කරණ අප්‍රධාන බවත් පෙන්වා දෙන්න. (ඇමුණුම 10)
- ස්වරයකින් අවසන් වන නාමපද ස්වරාන්ත නාම ලෙස පෙන්වා දෙන්න. (ඇමුණුම 11)
- අකාරාන්ත පුංලිඞ්ග **कुमार** ශබ්දය සියලු විභක්තිවල වරනගා පෙන්වන්න. (පෙළපොත 9.1 ක්‍රියාකාරකම)
- ඉකාරාන්ත පුංලිඞ්ග **मुनि** ශබ්දය සියලු විභක්තිවල වරනගා පෙන්වන්න. (පෙළපොත 12.1 ක්‍රියාකාරකම)

- උකාරාන්ත පුංලිඞ්ග **गुरु** ශබ්දය සියලු විභක්තිවල වරනගා පෙන්වන්න. (ඇමුණුම 12)
- ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග **लता** ශබ්දය සහ **बाला** ශබ්දය සියලු විභක්තිවල වරනගා පෙන්වන්න. (ඇමුණුම 13)
- අකාරාන්ත නපුංසකලිඞ්ග **फल** ශබ්දය සහ **मित्र** ශබ්දය සියලු විභක්තිවල වරනගා පෙන්වන්න. (පෙළපොත 13.1 ක්‍රියාකාරකම සහ ඇමුණුම 14)
- සර්වනාම කිහිපයක් සිසුන්ට ඉදිරිපත් කරන්න. (ඇමුණුම 15)
  **तद्** හා **एतद्** ශබ්ද ලිඞ්ගත්‍රයේ ප්‍රථමා විභක්තියෙහි වරනගා පෙන්වන්න. (ඇමුණුම 16)

පියවර 4

- නපුංසකලිඞ්ග නාම වරනැගීමේ දී ප්‍රථමා, ද්විතීයා හා තෘතීයා යන මුල් විභක්ති තුන හැර අනෙක් විභක්ති පුංලිඞ්ගයේ මෙන් ම සමාන ව වරනැගෙන බව පෙන්වා දෙන්න.
- ඇමුණුම 17 අභ්‍යාසයෙහි සිසුන් නිරත කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සංස්කෘත භාෂාවේ වචනත්‍රයක් ඇති බව ප්‍රකාශ කිරීම
- සංස්කෘත භාෂාවේ ලිඞ්ගත්‍රයක් ඇති බව පැහැදිලි කිරීම
- එදිනෙදා භාවිත වන පුංලිඞ්ග, ස්ත්‍රීලිඞ්ග සහ නපුංසකලිඞ්ග ශබ්ද වෙන් කර දැක්වීම
- පුංලිඞ්ගයේ අකාරාන්ත ශබ්ද, ස්ත්‍රීලිඞ්ගයේ ආකාරාන්ත ශබ්ද හා නපුංසකලිඞ්ගයේ අකාරාන්ත ශබ්ද සියලු විභක්තිවල වරනගා උචිත පරිදි භාවිත කිරීම
- නාමපදයක ශබ්දමූලය වෙන් කොට ප්‍රකාශ කිරීම
- අකාරාන්ත පුංලිඞ්ග සහ නපුංසකලිඞ්ග නාම, ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග නාම ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවල වරනගා මතකයෙන් කීම
- සර්වනාමවලට නිදසුන් ඉදිරිපත් කිරීම
- නාමපද හා සර්ව නාමපද වෙන් කර දක්වීම
- **तद्** හා **एतद्** ශබ්ද ලිඞ්ගත්‍රයේ ප්‍රථමා විභක්තියේ වරනැගීම
- දෙනු ලබන විවිධ ස්වරාන්ත නාම අකාරාන්ත, ආකාරාන්ත, ඉකාරාන්ත සහ උකාරාන්ත වශයෙන් පෙළගැස්වීම
- අකාරාන්ත පුංලිඞ්ග සහ නපුංසකලිඞ්ග නාම, ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග නාම මතකයෙන් වරනැගීම
- නාම වරනැගීමේ දී සමාන අසමානතා හඳුනාගෙන ප්‍රකාශ කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- සංස්කෘත භාෂාව - පළමුවන ශ්‍රේණිය, පෙළපොත
- ඇමුණුම - 1 සිට 17 දක්වා
- හුණු පුවරුව

ඇමුණුම 1

## අකාරාන්ත පුංලිඞ්ග නාමපද

| | | | |
|---|---|---|---|
| बालकः | (ළමයා) | गायकः | (ගායකයා) |
| आसन्दः | (පුටුව) | विद्यालयः | (පාසල) |
| दीपः | (පහන) | चषकः | (කෝප්පය) |
| सौचिकः | (රෙදි මසන්නා) | शुनकः | (බල්ලා) |
| बलीवर्दः | (ගොනා) | वृक्षः | (ගස) |
| कृषकः | (ගොවියා) | छात्रः | (ශිෂ්‍යයා) |
| अद्यापकः | (ගුරුවරයා) | युवकः | (තරුණයා) |
| शुकः | (ගිරවා) | | |

ඇමුණුම 2

## අකාරාන්ත පුංලිඞ්ග ශබ්ද ප්‍රථමා විභක්තියේ වරනැගීම

| मूलशब्द | | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|
| | | अः | औ | आः |
| बालक | - | बालकः | बालकौ | बालकाः |
| छात्र | - | छात्रः | छात्रौ | छात्राः |
| चषक | - | चषकः | चषकौ | चषकाः |
| सौचिक | - | सौचिकः | सौचिकौ | सौचिकाः |
| शुनक | - | शुनकः | शुनकौ | शुनकाः |

ඇමුණුම 3

## ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග නාමපද

| | | | |
|---|---|---|---|
| बालिका | (බාලිකාව) | चटका | (ගේ කිරිල්ලී) |
| घटिका | (ඔරලෝසුව) | महिला | (කාන්තාව) |
| लता | (වැල) | दोला | (දෝලාව) |
| माला | (මල්මාලාව) | नौका | (නැව) |
| मक्षिका | (මැස්සා) | गङ्गा | (ගඟ) |
| कुञ्चिका | (යතුර) | छुरिका | (දැළිපිහිය) |
| अध्यापिका | (ගුරුවරිය) | वीणा | (වීණාව) |

ඇමුණුම 4

## ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග ශබ්ද ප්‍රථමා විභක්තියේ වරනැගීම

| मूलशद्ब | | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|
| | | आ | ए | आः |
| बालिका | - | बालिका | बालिके | बालिकाः |
| अजा | - | अजा | अजे | अजाः |
| घटिका | - | घटिका | घटिके | घटिकाः |
| माला | - | माला | माले | मालाः |
| गायिका | - | गायिका | गायिके | गायिकाः |

ඇමුණුම 5

## අකාරාන්ත නපුංසකලිඞ්ග නාමපද

| | | | |
|---|---|---|---|
| खनित्रम् | (උදැල්ල) | फलम् | (ගෙඩිය) |
| रेलस्थानकम् | (දුම්රියපොළ) | करवस्त्रम् | (ලේන්සුව) |
| पुस्तकम् | (පොත) | गृहम् | (ගෙදර) |
| आम्रफलम् | (අඹගෙඩිය) | पुष्पम् | (මල) |
| कदलीफलम् | (කෙසෙල් ගෙඩිය) | | |

ඇමුණුම 6

## අකාරාන්ත නපුංසකලිඞ්ග ශබ්ද ප්‍රථමා විභක්තියේ වරනැගීම

| मूलशद्ब | | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|
| | | अम् | ए | आनि |
| गृह | - | गृहम् | गृहे | गृहाणि |
| पुस्तक | - | पुस्तकम् | पुस्तके | पुस्तकानि |
| फल | - | फलम् | फले | फलानि |
| करवस्त्र | - | करवस्त्रम् | करवस्त्रे | करवस्त्राणि |
| भवन | - | भवनम् | भवने | भवनानि |

ඇමුණුම 7

| අකාරාන්ත පුංලිඞ්ග ශබ්ද | | ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග ශබ්ද | | අකාරාන්ත නපුංසකලිඞ්ග ශබ්ද | |
|---|---|---|---|---|---|
| ශබ්දමූලය | ප්‍රථමා ඒක වචනරූපය | ශබ්දමූලය | ප්‍රථමා ඒක වචනරූපය | ශබ්දමූලය | ප්‍රථමා ඒක වචනරූපය |
| नर | नरः | माला | माला | मित्र | मित्रम् |
| मनुष्य | मनुष्यः | कन्या | कन्या | पाप | पापम् |
| वृक्ष | वृक्षः | छाया | छाया | धन | धनम् |
| पर्वत | पर्वतः | विद्या | विद्या | पुष्प | पुष्पम् |
| देव | देवः | प्रज्ञा | प्रज्ञा | रूप | रूपम् |
| अश्व | अश्वः | तृष्णा | तृष्णा | वन | वनम् |
| कुमार | कुमारः | वीणा | वीणा | चित्र | चित्रम् |

ඇමුණුම 8

අකාරාන්ත පුංලිඞ්ග ශබ්ද

| शब्द् | विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|
| सूद | प्रथमा | सूदः | सूदौ | सूदाः |
| | द्वितीया | सूदम् | सूदौ | सूदान् |
| योध | प्रथमा | योधः | योधौ | योधाः |
| | द्वितीया | योधम् | योधौ | योधान् |
| चोर | प्रथमा | चोरः | चोरौ | चोराः |
| | द्वितीया | चोरम् | चोरौ | चोरान् |

ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග ශබ්ද

| | | | | |
|---|---|---|---|---|
| माला | प्रथमा | माला | माले | मालाः |
| | द्वितीया | मालाम् | माले | मालाः |
| वीणा | प्रथमा | वीणा | वीणे | वीणाः |
| | द्वितीया | वीणाम् | वीणे | वीणाः |
| कन्या | प्रथमा | कन्या | कन्ये | कन्याः |
| | द्वितीया | कन्याम् | कन्ये | कन्याः |

අකාරාන්ත නපුංසකලිඞ්ග ශබ්ද

| | | | | |
|---|---|---|---|---|
| मित्र | प्रथमा | मित्रम् | मित्रे | मित्राणि |
| | द्वितीया | मित्रम् | मित्रे | मित्राणि |
| पाप | प्रथमा | पापम् | पापे | पापानि |
| | द्वितीया | पापम् | पापे | पापानि |
| धन | प्रथमा | धनम् | धने | धनानि |
| | द्वितीया | धनम् | धने | धनानि |

ඇමුණුම 9

ලිඞ්ගත්‍රයේ නාමපද වෙනුවට සර්ව නාම යෙදෙන ආකාරය

१. बालकः लिखति। सः न पठति।
२. बालिका पठति। सा न लिखति।
३. तत् फलं मधुरम्।
४. एषः वृक्षः।
५. एषा वाटिका।
६. एतत् फलम्।

| संज्ञा | सर्वनाम | लिङ्गम् |
|---|---|---|
| बालकः | सः | पुंलिङ्गम् |
| बालिका | सा | स्त्रीलिङ्गम् |
| फलम् | तत् | नपुंसकलिङ्गम् |
| वृक्षः | एषः | पुंलिङ्गम् |
| वाटिका | एषा | स्त्रीलिङ्गम् |
| फलम् | एतत् | नपुंसकलिङ्गम् |

ඇමුණුම 10

| විභක්ති | ප්‍රථමා විභක්ති ඒකවචනය | අර්ථය |
|---|---|---|
| प्रथमा | कुमारः | කුමාරයා |
| सम्बोधन | हे कुमारः | පින්වත් කුමාරය |
| द्वितीया | कुमारम् | කුමාරයා |
| तृतीया/करण | कुमारेण | කුමාරයා විසින්/කුමාරයා සමග |
| चतुर्थी | कुमाराय | කුමාරයාට |
| पञ्चमी | कुमारात् | කුමාරයාගෙන් |
| षष्ठी | कुमारस्य | කුමාරයාගේ |
| सप्तमी | कुमारे | කුමාරයා කෙරෙහි |

ඇමුණුම 11

| නාමය | අන්ත්‍ය ස්වරය වෙන්කිරීම | අන්තය |
|---|---|---|
| बालक | बालक् + अ | अ කාරාන්ත |
| माला | माल् + आ | आ කාරාන්ත |
| मुनि | मुन् + इ | इ කාරාන්ත |
| गिरि | गिर् + इ | इ කාරාන්ත |
| गुरु | गुर् + उ | उ කාරාන්ත |
| तरु | तर् + उ | उ කාරාන්ත |
| पितृ | पित् + ऋ | ऋ කාරාන්ත |
| भ्रातृ | भ्रात् + ऋ | ऋ කාරාන්ත |

ඇමුණුම 12

උකාරාන්ත පුංලිඞ්ග **गुरु** ශබ්දය වරනැගීම

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | गुरुः | गुरू | गुरवः |
| सम्बोधन | हे गुरो | हे गुरू | हे गुरवः |
| द्वितीया | गुरुम् | गुरू | गुरून् |
| तृतीया | गुरुणा | गुरुभ्याम् | गुरुभिः |
| चतुर्थी | गुरवे | गुरुभ्याम् | गुरुभ्यः |
| पञ्चमी | गुरोः | गुरुभ्याम् | गुरुभ्यः |
| षष्ठी | गुरोः | गुर्वोः | गुरूणाम् |
| सप्तमी | गुरौ | गुर्वोः | गुरुषु |

ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග लता ශබ්දය වරනැගීම

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | लता | लते | लताः |
| सम्बोधन | हे लते | हे लते | हे लताः |
| द्वितीया | लताम् | लते | लताः |
| तृतीया | लतया | लताभ्याम् | लताभिः |
| चतुर्थी | लतायै | लताभ्याम् | लताभ्यः |
| पञ्चमी | लतायाः | लताभ्याम् | लताभ्यः |
| षष्ठी | लतायाः | लतयोः | लतानाम् |
| सप्तमी | लतायाम् | लतयोः | लतासु |

ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග बाला ශබ්දය වරනැගීම

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | बाला | बाले | बालाः |
| सम्बोधन | हे बाले | हे बाले | हे बालाः |
| द्वितीया | बालाम् | बाले | बालाः |
| तृतीया | बालया | बालाभ्याम् | बालाभिः |
| चतुर्थी | बालायै | बालाभ्याम् | बालाभ्यः |
| पञ्चमी | बालायाः | बालाभ्याम् | बालाभ्यः |
| षष्ठी | बालायाः | बालयोः | बालानाम् |
| सप्तमी | बालायाम् | बालयोः | बालासु |

ඇමුණුම 14

## ආකාරාන්ත පුංලිඞ්ග मित्र ශබ්දය වරනැගීම

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | मित्रम् | मित्रे | मित्राणि |
| सम्बोधन | हे मित्र | हे मित्रे | हे मित्राणि |
| द्वितीया | मित्रम् | मित्रे | मित्राणि |
| तृतीया | मित्रेण | मित्राभ्याम् | मित्रैः |
| चतुर्थी | मित्राय | मित्राभ्याम् | मित्रेभ्यः |
| पञ्चमी | मित्रात् | मित्राभ्याम् | मित्रेभ्यः |
| षष्ठी | मित्रस्य | मित्रयोः | मित्राणाम् |
| सप्तमी | मित्रे | मित्रयोः | मित्रेषु |

ඇමුණුම 15

සර්වනාම කිහිපයක් යෙදුණු අවස්ථා

१. सः पुरुषः। ඒ පුරුෂයා
२. सः शुनकः। ඒ බල්ලා
३. तौ बुद्धौ। ඒ බුදුවරු දෙදෙනා
४. तौ कुमारौ। ඒ කුමාරවරු දෙදෙනා
५. ते काकाः। ඒ කපුටෝ
६. ते वृक्षाः। ඒ ගස්

ඇමුණුම 16

## तद् සහ एतद् ශබ්ද ලිඞ්ගත්‍රයේ ප්‍රථමා විභක්තියේ වරනැගීම

| लिङ्गम् | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| पुंलिङ्ग | सः | तौ | ते |
| स्त्रीलिङ्ग | सा | ते | ताः |
| नपुंसकलिङ्ग | तत् | ते | तानि |
| पुंलिङ्ग | एषः | एतौ | एते |
| स्त्रीलिङ्ग | एषा | एते | एताः |
| नपुंसकलिङ्ग | एतत् | एते | एतानि |

1. प्राकार। छाया। दातृ। प्रज्ञा। सूनु। भानु। असि। तृष्णा। रवि। जामातृ। घ्राण। धान्य। नृ। बन्धु। केतु। कर्तृ। भूपति। यक्ष। सुर। जन्तु। कृमि। गृहपति। भ्रातृ। निधि।
යන පදවල අන්තය නම් කරන්න.

2. පහත සඳහන් **जनक** ශබ්දයේ හිස්තැන් පුරවන්න.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | जनकः | | जनकाः |
| सम्बोधन | हे जनक | | |
| द्वितीया | | जनकौ | |
| तृतीया | | जनकाभ्याम् | जनकैः |
| चतुर्थी | जनकाय | जनकाभ्याम् | जनकेभ्यः |
| पञ्चमी | | जनकाभ्याम् | |
| षष्ठी | | जनकयोः | जनकानाम् |
| सप्तमी | जनके | | जनकेषु |

3. පහත සඳහන් **मणि** ශබ්දයේ හිස්තැන් පුරවන්න.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | मणिः | | मणयः |
| सम्बोधन | हे मणे | | |
| द्वितीया | | मणी | |
| तृतीया | | मणिभ्याम् | मणिभिः |
| चतुर्थी | मणये | मणिभ्याम् | मणिभ्यः |
| पञ्चमी | | मणिभ्याम् | |
| षष्ठी | | मण्योः | मणीनाम् |
| सप्तमी | मणौ | | मणिषु |

4. පහත සඳහන් साधु ශබ්දයේ හිස්තැන් පුරවන්න.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | साधुः | | साधवः |
| सम्बोधन | हे साधो | | |
| द्वितीया | | साधू | |
| तृतीया | | साधुभ्याम् | साधुभिः |
| चतुर्थी | साधवे | साधुभ्याम् | साधुभ्यः |
| पञ्चमी | | साधुभ्याम् | |
| षष्ठी | | साध्वोः | साधूनाम् |
| सप्तमी | साधौ | | साधुषु |

# පාඩම 6 - ආඛ්‍යාතපද

**නිපුණතාව** : 3.1 සංස්කෘත භාෂාවේ ආඛ්‍යාතපද (අවසාන ක්‍රියාපද) නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 3.1 ආඛ්‍යාතවල ධාතුමූලය වෙන් කරයි.
3.2 ලට්, ලඞ් පරස්මෛපද ප්‍රත්‍යය සහිත ආඛ්‍යාතපද (අවසාන ක්‍රියාපද) නම් කරයි.

**කාලච්ඡේද** : 20 යි

**ඉගෙනුම් පල** :

- දෙනු ලබන ආඛ්‍යාතපදයක (අවසාන ක්‍රියාපදයක) ධාතුමූලය ඉස්මතු කර පෙන්වයි.
- දෙනු ලබන ආඛ්‍යාතපදවලට අදාළ ධාතුමූලය සහ ලට්, ලඞ් පරස්මෛපද ප්‍රත්‍යය වියුක්ත කර දක්වයි.
- ලට්, ලඞ් පරස්මෛපද ප්‍රත්‍යය අදාළ අනුපිළිවෙළට වාචෝද්ගත ව ඉදිරිපත් කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**ප්‍රවේශය :**

අහං පඨාමි සංස්කෘතම්

අහං වදාමි සංස්කෘතම්

අහං ලිඛාමි සංස්කෘතම්

සදෛව සුන්දරාක්ෂරම්

අහං පඨාමි සංස්කෘතම්....//

අහං ස්මරාමි මාතරම්

අහං භජාමි මාතරම්

අහං නමාමි මාතරම්

සදෛව භක්තිපූර්වකම්

අහං පඨාමි සංස්කෘතම්....//

- පාඨමාලා 1 පොතේ සඳහන් මෙම ගීතය ගායනා කරන්න.
- එහි සඳහන්වන ක්‍රියාපද මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරන්න.

**පාඩම සංවර්ධනය :**

1 **පියවර :**

- ඇමුණුම 1 හි ඇති ලට් ලකාර ධාතූන් වරනැගෙන වගුව සිසුන්ට ලබා දී, එය නිවැරදි ව උච්චාරණය කර කට පාඩම් කිරීමට සිසුන් යොමු කරන්න.
- ක්‍රියාපදයක ධාතුමූලය වෙන් කොට පෙන්වා, එම ක්‍රියාපද සියල්ල සිසුන් සමග සාමූහික ව වරනගන්න.

| | | | |
|---|---|---|---|
| **पत् - पतति** | (වැටෙයි) | **पठ् - पठति** | (පාඩම් කරයි) |
| **धाव् - धावति** | (දුවයි) | **नम् - नमति** | (වඳියි) |
| **पच् - पचति** | (උයයි) | **हस् - हसति** | (සිනාසෙයි) |

- එයින් එක් ක්‍රියාපදයක් නිවැරදි අක්ෂර භාවිත කොට අභ්‍යාස පොතේ ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
- පෙළ පොතේ 08 පාඩමට අදාළ අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරවන්න.
- ඇමුණුම 2හි ඇති ලඞ් ලකාර ධාතූන් වරනැගෙන වගු දෙක සිසුන්ට ලබා දී, එය නිවැරදි ව උච්චාරණය කර කටපාඩම් කිරීමට සිසුන් යොමු කරන්න.
- පහත ආකාරයට ක්‍රියාපදයක ධාතුමූලය වෙන් කොට පෙන්වා, ලඞ් ලකාරය සඳහා ධාතුවට මුලින් අකාරයක් යෙදෙන බව පෙන්වා දෙන්න.
- එම ක්‍රියාපද සියල්ල ම සිසුන් සමග සාමූහික ව වරනගන්න.

| වර්තමාන 'ලට්' | අතීත 'ලඞ්' | | | | | |
|---|---|---|---|---|---|---|
| **गच्छति ।** (යයි) | **अ + गच्छ् + त्** | - | **अगच्छत् ।** | (ගියේ ය) | | |
| **पतति ।** (වැටෙයි) | **अ + पत् + त्** | - | **अपतत् ।** | (වැටුණේ ය) | | |
| | **पठ्** - **अपठत्** | (පාඩම් කළේ ය) | | **भू** - **अभवत्** | (විය) | |
| | **नम्** - **अनमत्** | (වැන්දේ ය) | | **पच्** - **अपचत्** | (පිසුවේ ය) | |
| | **वद्** - **अवदत्** | (කීවේ ය) | | **खाद्** - **अखादत्** | (කෑවේ ය) | |

- එයින් එක් ක්‍රියාපදයක් නිවැරදි අක්ෂර භාවිත කොට අභ්‍යාස පොතේ ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
- පෙළපොතේ 15 පාඩමට අදාළ අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරවන්න.
- ඇමුණුම 03 අභ්‍යාසයෙහි සිසුන් නිරත කරවන්න.

**මූලික වදන් සංකල්පය :**

- ලට් - වර්තමානකාලය, ලඞ් - අතීතකාලය

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ලට් හා ලඞ් පරස්මෛපද ක්‍රියාපද මතකයෙන් වරනැගීම
- ලට් හා ලඞ් පරස්මෛපද ක්‍රියාපද නිවැරදි ව ලිවීම
- පුරුෂ හා වචන භේදයට අනුකූල ව සිංහල ක්‍රියාපද සංස්කෘතයටත්, සංස්කෘත ක්‍රියාපද සිංහලයටත් පරිවර්තනය කිරීම
- වර්තමානකාල ක්‍රියාපද අතීතකාලයටත්, අතීතකාල ක්‍රියාපද වර්තමානකාලයටත් පරිවර්තනය කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1 - 2 සහ 3
- සංස්කෘත භාෂාව - පළමුවන ශ්‍රේණිය, පෙළපොත

ඇමුණුම 1

ලට් ලකාර පරස්මෛපද ප්‍රත්‍යයන් සහ **लिख्** ධාතුව වරනැගෙන අයුරු

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|---|---|
| प्रथमपुरुष | ति | तः | न्ति | लिखति<br>ලියයි | लिखतः<br>(දෙදෙන) ලියත් | लिखन्ति<br>ලියති |
| मध्यमपुरुष | सि | थः | थ | लिखसि<br>ලියහි | लिखथः<br>(දෙදෙන) ලියහු | लिखथ<br>ලියහු |
| उत्तमपुरुष | मि | वः | मः | लिखामि<br>ලියමි | लिखावः<br>(දෙදෙන) ලියමු | लिखामः<br>ලියමු |

ඇමුණුම 2

ලඞ් ලකාර පරස්මෛපද ප්‍රත්‍යයන් සහ **गम्** ධාතුව වරනැගෙන අයුරු

වගුව i

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|---|---|
| प्रथमपुरुष | त् | ताम् | अन् | अगच्छत्<br>ගියේ ය | अगच्छताम्<br>(දෙදෙන) ගියහ | अगच्छन्<br>ගියහ |
| मध्यमपुरुष | : | तम् | त | अगच्छः<br>ගියෙහි | अगच्छतम्<br>(දෙදෙන) ගියෙහු | अगच्छत<br>ගියෙහු |
| उत्तमपुरुष | अम् | व | म | अगच्छम्<br>ගියෙමි | अगच्छाव<br>(දෙදෙන) ගියෙමු | अगच्छाम<br>ගියෙමු |

වගුව ii

| අනු අංක | ධාතුව | ලට් (වර්තමාන) | | ලඞ් (අතීත) | |
|---|---|---|---|---|---|
| 01. | कृ | करोति | (කරයි) | अकरोत् | (කළේ ය) |
| 02. | क्रीड् | क्रीडति | (ක්‍රීඩා කරයි) | अक्रीडत् | (ක්‍රීඩා කළේ ය) |
| 03. | चुर् | चोरयति | (සොරකම් කරයි) | अचोरयत् | (සොරකම් කළේය) |
| 04. | तुष् | तुष्यति | (සතුටු වෙයි) | अतुष्यत् | (සතුටු විය) |
| 05. | धाव् | धावति | (දුවයි) | अधावत् | (දිව්වේ ය) |
| 06. | गै | गायति | (ගායනා කරයි) | अगायत् | (ගායනා කළේ ය) |
| 07. | जि | जयति | (දිනයි) | अजयत् | (දිනුවේ ය) |
| 08. | नी | नयति | (ගෙන යයි) | अनयत् | (ගෙන ගියේ ය) |
| 09. | वद् | वदति | (කියයි) | अवदत् | (කීවේ ය) |
| 10. | वस् | वसति | (වාසය කරයි) | अवसत् | (වාසය කළේ ය) |

ඇමුණුම 3

√पत् ධාතුව ( पतति ) වර්තමාන (ලට්) පරස්මෛපදයෙහි වරනගා දක්වන්න.

වගුව i

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | पतति | | |
| मध्यमपुरुष | | | पतथ |
| उत्तमपुरुष | | पतावः | |

√पठ् ධාතුව ( अपठत् ) අතීත (ලඞ්) පරස්මෛපදයෙහි වරනගා දක්වන්න.

වගුව ii

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | अपठत् | | |
| मध्यमपुरुष | | | अपठत |
| उत्तमपुरुष | | अपठाव | |

# පාඩම 7 - වාක්‍යනිර්මාණය - i

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | : | 4.0 | සංස්කෘත භාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍යනිර්මාණය කරයි. |
| **නිපුණතා මට්ටම** | : | 4.1 | උක්තය හා ආඛ්‍යාතය පමණක් ඇති සරල වාක්‍ය ගොඩනගයි. |
| **කාලච්ඡේද** | : | 15 යි | |

**ඉගෙනුම් පල** :

- උක්තය හා ආඛ්‍යාතය පමණක් ඇති සරල සංස්කෘත වාක්‍යය දේවනාගරී අකුරින් ලියයි.
- මාධ්‍ය භාෂාවෙන් හා සංස්කෘත භාෂාවෙන් (වර්තමානකාල ප්‍රථමපුරුෂ ඒකවචන ක්‍රියාපද සහිත) පද දෙකේ වාක්‍යය ගොඩනගයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- උක්තාඛ්‍යාත පමණක් ඇති වර්තමාන කාල සරල සිංහල වාක්‍ය කිහිපයක් සිසුන් සමග සාකච්ඡා කරන්න. නිදඃ කුරුල්ලා පියාඹයි/අම්මා උයයි/බල්ලා බුරයි
- පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා එක් කණ්ඩායමක් විසින් උක්තයක් ඉදිරිපත් කළ විට ඊට අදාළ ආඛ්‍යාතය ප්‍රකාශ කිරීමට අනෙක් කණ්ඩායම මෙහෙයවන්න.

**පාඩම් සංවර්ධනය :**

**පියවර 1**

- ඇමුණුම 1 පරිදි මාධ්‍ය භාෂාවේ උක්තාර්ථ ඒකවචනපද කිහිපයක් සහ ඊට අදාළ සංස්කෘතපද සිසුන් සමග කියවන්න.
- ඇමුණුම 2 පරිදි මාධ්‍ය භාෂාවේ ඇති ආඛ්‍යාතපද හා ඊට අදාළ සංස්කෘතපද සිසුන් සමග කියවන්න.
- ඇමුණුම 3 පරිදි මාධ්‍ය භාෂාවෙන් හා සංස්කෘත භාෂාවෙන් නිවැරදි ව පද දෙකේ වාක්‍ය ගොඩනැගීමට සිසුන් යොමු කරන්න.
- උක්තයක් සහ ආඛ්‍යාතයක් පමණක් ඇති සරල සිංහල වාක්‍ය ඉදිරිපත් කරමින් ඒවා සංස්කෘත භාෂාවෙන් ප්‍රකාශ කිරීමට සිසුන් යොමු කරන්න.
- උක්ත ආඛ්‍යාත සහිත සරල වාක්‍ය කිහිපයක් මාධ්‍ය භාෂාවෙන් ලියා ඒවා සංස්කෘත භාෂාවට නගා දේවනාගරී අකුරින් හුණු පුවරුවේ ලියා පෙන්වන්න.
- පෙළපොතෙහි 6.1 හි දැක්වෙන චිත්‍රයට අදාළ ව උක්ත ආඛ්‍යාත සම්බන්ධ වාක්‍ය සංස්කෘත භාෂාවෙන් නිර්මාණය කර දේවනාගරී අකුරෙන් ලියවන්න.
- සංස්කෘත පෙළ පොත පළමුවන ශ්‍රේණියට අදාළ 6 සිට 17 පාඩම් කෙරෙහි අවධානය යොමු කරන්න.
- ඇමුණුම 4 අභ්‍යාසයෙහි සිසුන් නිරත කරවන්න.

**මූලික වදන් සංකල්පය :**

- උක්තය
- ආඛ්‍යාතය

**ඇගයීම හා තක්සේරුකරණය :**

- පරිසරයේ සිදුවීම් ආශ්‍රයෙන් පද දෙකේ සරල සංස්කෘත වාක්‍ය (වර්තමානකාල ඒකවචන) නිර්මාණය කර දේවනාගරී අකුරින් ලිවීම
- උක්ත ආඛ්‍යාත ගළපමින් සරල සංස්කෘත වාක්‍ය ප්‍රකාශ කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම - 1, 2, 3 සහ 4
- සංස්කෘත භාෂාව - පළමුවන ශ්‍රේණිය, පෙළපොත

ඇමුණුම 1

| | | |
|---|---|---|
| කුමාරයා | - | कुमारः |
| එළුවා | - | अजः |
| කපුටා | - | काकः |
| බල්ලා | - | शुनकः |
| යෝධයා | - | योधः |
| සොරා | - | चोरः |
| ලේනා | - | कलन्दकः |
| අශ්වයා | - | अश्वः |

ඇමුණුම 2

| | | |
|---|---|---|
| සිනාසෙයි | - | हसति । |
| කයි | - | खादति । |
| වැටෙයි | - | पतति । |
| දුවයි | - | धावति । |
| බොයි | - | पिबति । |
| යයි | - | गच्छति । |
| සිටියි | - | तिष्ठति । |
| ගෙනයයි | - | नयति । |

ඇමුණුම 3

පියවර 01

| | | | | | |
|---|---|---|---|---|---|
| කුමාරයා | - | कुमारः | සිනාසෙයි | - | हसति । |
| එළුවා | - | अजः | කයි | - | खादति । |
| කපුටා | - | काकः | සිටියි | - | तिष्ठति । |
| බල්ලා | - | शुनकः | දුවයි | - | धावति । |
| යෝධයා | - | योधः | ගෙනයයි | - | नयति । |

පියවර 02

| | |
|---|---|
| කුමාරයා සිනාසෙයි. | कुमारः हसति । |
| එළුවා කයි. | अजः खादति । |
| කපුටා සිටියි. | काकः तिष्ठति । |
| බල්ලා දුවයි. | शुनकः धावति । |
| යෝධයා ගෙන යයි. | योधः नयति । |

ඇමුණුම 4

1. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

०१. बालकाः गच्छन्ति ।

०२. अहं लिखामि ।

०३. यूयं पठथ ।

०४. शुनकौ धावतः ।

०५. सः अगच्छत् ।

०६. उपासकाः अनमन् ।

०७. आवां गच्छावः ।

०८. कपयः खादन्ति ।

०९. साधवः उपदिशन्ति ।

१०. वयं अयच्छाम ।

2. පහත සඳහන් වාක්‍ය සංස්කෘතට නගා දේවනාගරී අකුරින් ලියන්න.

01. අපි වඳිමු.

02. නුඹ දුවහි.

03. මිත්‍රයා දෙයි.

04. රජවරු යති.

05. මම යමි.

06. සිංහයා දිව්වේ ය.

07. ළමයා ක්‍රීඩා කළේ ය.

08. සොරු සොරකම් කළහ.

09. ගායකයෝ දෙදෙනා ගායනා කරත්.

10. ගුරුවරයා දුන්නේ ය.

# පාඩම 8 - වාක්‍යනිර්මාණය - ii

**නිපුණතාව** : 4.0 සංස්කෘත භාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍යනිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම** : 4.2 පුරුෂභේදය සහ වචනභේදය සැලකිල්ලට ගනිමින් සරල වාක්‍ය ගොඩනගයි.

**කාලච්ඡේද** : 25 යි

**ඉගෙනුම් පල** :

- ලියනු ලබන සරල වාක්‍යවල ආඛ්‍යාතය ප්‍රථමපුරුෂ, මධ්‍යමපුරුෂ සහ උත්තමපුරුෂ ලෙස කාණ්ඩ කරයි.
- ආඛ්‍යාතය ප්‍රථමපුරුෂ, මධ්‍යමපුරුෂ හෝ උත්තමපුරුෂ ලෙස ලිවීමට පවරනු ලැබූ විට අදාළ සරල වාක්‍යයක් නිවැරදි ව ගොඩනගයි.
- වාක්‍යවල ආඛ්‍යාතය ඒකවචන, ද්විවචන, බහුවචන ලෙස වර්ග කර පෙන්වයි.
- ඒකවචන, ද්විවචන, බහුවචන ආඛ්‍යාතය සහිත සරල වාක්‍ය ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- සිසුන් එළිමහනට කැඳවා ගෙන යන්න.
- ඇමුණුම 1 පිටු පෙරළනයෙහි පළමු වන පිටුව යොදා ගනිමින් වර්තමාන කාල පරස්මෛපදයේ වරනගන ලද ක්‍රියාපදයක් ප්‍රදර්ශනය කරන්න.
- එහි වරනැගීම හඬනගා කියවන්න.
- අකාරන්ත, ඉකාරන්ත, උකාරන්ත ශබ්ද කිහිපයක් ප්‍රථමා විභක්තියේ පමණක් වරනගන ලද (පිටු පෙරළනයෙහි) දෙවන පිටුව ප්‍රදර්ශනය කරන්න.
- එම ශබ්ද සිසුන් සමග කියවන්න.
- **अस्मद्** , **युष्मद्** ශබ්දවල ප්‍රථමා විභක්ති රූප හා **तत्** , **इदम्** , **किम्** ශබ්දවල පුරුෂලිඞ්ග ප්‍රථමා විභක්ති රූප පමණක් දැක්වෙන (පිටු පෙරළනයෙහි) තෙවන පිටුව ප්‍රදර්ශනය කරන්න.
- වරනැගීම්වල වෙනස සිසුනට පෙන්වා දෙන්න.

**පාඩම් සංවර්ධනය :**

- වාක්‍යයක උක්තපදය හා ක්‍රියාපදය අතර සම්බන්ධයක් ඇති බව පෙන්වා දෙන්න.
- නාමපදයක් ප්‍රථමා විභක්තියේ ඒකවචන, ද්විවචන, බහුවචන වශයෙන් ත්‍රිවිධාකාර ව වරනැගෙන බව පෙන්වන්න.
- ආඛ්‍යාතයක් ප්‍රථමපුරුෂ, මධ්‍යමපුරුෂ, උත්තමපුරුෂ ඒකවචන, ද්විවචන, බහුවචන ලෙස වරනැගෙන අයුරු පැහැදිලි කරන්න.
- වාක්‍යයක ඒකවචන, ද්විවචන, බහුවචන නාමපදයක් පිළිවෙළින් ඒකවචන, ද්විවචන, බහුවචන ආඛ්‍යාතයක් සමග පමණක් යෙදෙන බව පෙන්වා දෙන්න.
- **अस्मद्** , **युष्मद्** ශබ්ද හැර ප්‍රථමා විභක්ති නාමපදයක් ප්‍රථමපුරුෂ ආඛ්‍යාතයක් සමග පමණක් යෙදෙන අයුරු විස්තර කරන්න.

- त्वम् , युवाम् , यूयम् යන සර්ව නාමපද මධ්‍යමපුරුෂ ආඛ්‍යාතයක් සමග මිස වෙනත් පුරුෂයක ආඛ්‍යාතපදයක් සමග සම්බන්ධ නොවන බව පහදා දෙන්න.
- अहम् , आवाम् , वयम् යන සර්වනාම උක්තපද උත්තමපුරුෂ ආඛ්‍යාතපද සමග පමණක් ම යෙදෙන බව පෙන්වා දෙන්න.
- වාක්‍යයක උක්තාඛ්‍යාතපද පමණක් නොව කර්මපදයක් ද යොදා වාක්‍ය දීර්ඝ කළ හැකි බව පෙන්වා දෙන්න.
- උක්තය, වාක්‍යයක ප්‍රථමා විභක්තියෙන් යෙදෙන අතර කර්මය, ද්විතීයා විභක්තියෙන් යෙදෙන බව විස්තර කරන්න.
- වාක්‍යයක උක්තාඛ්‍යාත අතරට කරණාර්ථය ප්‍රකට කරන පදයක් යොදා වාක්‍ය නිර්මාණය කළ හැකි අයුරු වටහා දෙන්න.
- වාක්‍යයක ක්‍රියාපදය අතීත කාලයෙන් යෙදූ විට, එම වාක්‍යය අතීතකාල වාක්‍යයක් වන බව ද, අනාගත කාලයෙන් යෙදූ විට එම වාක්‍ය අනාගතකාල වාක්‍යයක් වන බව ද පෙන්වා දෙන්න.
- උක්තාඛ්‍යාත කර්ම සහිත සරල වාක්‍ය අවබෝධය සඳහා පෙළ පොතෙහි 6 සිට 17 දක්වා පාඩම්වල අභ්‍යාස කරවන්න.

**මූලික වදන් සංකල්පය :**

- කර්මය  - ආඛ්‍යාතයට යටත්වන පදය
- උක්තාර්ථය
- කරණාර්ථය

**ඇගයීම හා තක්සේරුකරණය :**

- දේවනාගරී අකුරින් දෙනු ලබන ප්‍රථමා විභක්ති නාමපදවලට සුදුසු වර්තමානකාල ආඛ්‍යාත යොදා වාක්‍ය ගොඩනැගීම
- දේවනාගරී අකුරින් දෙනු ලබන වර්තමානකාල ක්‍රියාපදවලට සුදුසු ප්‍රථමා විභක්ති නාමපද යොදා වාක්‍ය ගොඩනැගීම
- උක්තාඛ්‍යාත සහිත වාක්‍යවල කරණාර්ථය ප්‍රකට කරන වචන සුදුසු ලෙස යෙදීම
- මාධ්‍ය භාෂාවෙන් සපයා ඇති උක්තාඛ්‍යාත කර්මපද සහිත සරල වාක්‍ය සංස්කෘත භාෂාවට හරවා දේවනාගරී අකුරෙන් ලිවීම
- උක්තාඛ්‍යාත කර්මපද සහිත සරල වාක්‍ය කිහිපයක් සංස්කෘත භාෂාවෙන් මාධ්‍ය භාෂාවට හරවා ලිවීම
- වර්තමානකාල ආඛ්‍යාත සහිත වාක්‍ය කිහිපයක් අතීතයටත් අනාගතයටත් හැරවීම
- පෙළපොතේ 12.1 රූපය අනුසාරයෙන් සරල වාක්‍ය නිර්මාණය කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- එළිමහන් පිරිවෙන් පරිශ්‍රය
- ඇමුණුම 1 අනුව සකසා ගත්  පිටු පෙරළනය
- සංස්කෘත භාෂාව -  පළමුවන ශ්‍රේණිය, පෙළපොත

## පිටු පෙරළනය

පළමුවන පිටුව **पच्** ධාතුව - වර්තමානකාලය - පරස්මෛපදය

| පුරුෂය | එකවචන | ද්විවචන | බහුවචන |
|---|---|---|---|
| ප්‍රථමපුරුෂ | पठति | पठतः | पठन्ति |
| මධ්‍යමපුරුෂ | पठसि | पठथः | पठथ |
| උත්තමපුරුෂ | पठामि | पठावः | पठामः |

දෙවන පිටුව ප්‍රථමා විභක්තියේ වරනගන ලද ශබ්ද කිහිපයක්

| ශබ්දය | එකවචන | ද්විවචන | බහුවචන |
|---|---|---|---|
| कुमार | कुमारः | कुमारौ | कुमाराः |
| यति | यतिः | यती | यतयः |
| तरु | तरुः | तरू | तरवः |

තෙවන පිටුව ප්‍රථමා විභක්තියේ වරනගන ලද සර්වනාම ශබ්ද කිහිපයක්

| ශබ්දය | එකවචන | ද්විවචන | බහුවචන |
|---|---|---|---|
| अस्मद् | अहं | आवाम् | वयम् |
| युष्मद् | त्वं | युवाम् | यूयम् |
| तत् | सः | तौ | ते |
| इदम् | अयं | इमौ | इमे |
| किम् | कः | कौ | के |

# පාඩම 9 - නිර්දිෂ්ටග්‍රන්ථ - බාලාදර්ශය

**නිපුණතාව** : 5.0 නිර්දිෂ්ටග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 5.1 බාලාදර්ශයේ ශ්ලෝක දේවනාගරී අක්‍ෂරවලින් ද, සිංහල අක්‍ෂරවලින් ද, ලියමින් වාචෝද්ගත කරයි.

**කාලච්ඡේද** : 20 යි

**ඉගෙනුම් පල** :

- බාලාදර්ශයේ 30 වැනි පාඩමෙහි එන උපදේශමාලා ශ්ලෝක කට පාඩමින් කියයි.
- බාලාදර්ශයේ 30 වැනි පාඩම දේවනාගරී අක්ෂරවලින් ලියයි.
- බාලාදර්ශයේ 30 වැනි පාඩම සිංහල අක්ෂරවලින් ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**

**ප්‍රවේශය :**

- ශිෂ්‍යයන් පිරිවෙන් පරිශ්‍රයට කැඳවා ගෙන යන්න.
- බාලාදර්ශයේ 30 වන පාඩමේ එන ශ්ලෝකයක් සජ්ඣායනා කරන්න.
- එහි අදහස පෙන්වමින් සිසුන් සමග පිළිසඳරක යෙදෙන්න.
- බාලාදර්ශය යනු බාලයන්ට ආදර්ශ සපයන ග්‍රන්ථයක් බව පහදා දෙන්න.

**පාඩම සංවර්ධනය :**

- බාලාදර්ශ 30 වන පාඩමෙහි උපදේශමාලා ශ්ලෝක සිසුන් සමග ශබ්ද නගා කියවන්න.
- එක් එක් ශිෂ්‍යයාට පිළිවෙළින් සම්බන්ධ වී ශ්ලෝකයක පදයක් බැගින් සජ්ඣායනා කරන්නට අවස්ථාව දෙන්න.
- කියවන ලද එම ශ්ලෝක සිසුන් සමග සාමූහික ව සජ්ඣායනා කරන්න.
- සියලු දෙනා සාමූහික ව සජ්ඣායනා කරමින් වාචෝද්ගත කිරීමට උනන්දු කරවන්න.
- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා ශ්ලෝක බෙදා දී මාරුවෙන් මාරුවට මතකයෙන් තරගයට ගායනා කරවන්න.
- කියවන ලද ශ්ලෝක අසා ලිවීමක් ලෙස සිංහල අකුරෙන් අභ්‍යාස පොතේ ලියවන්න.
- ලියන ලද ශ්ලෝක දේවනාගරී අකුරෙන් ලිවීමට උපදෙස් දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- බාලාදර්ශයේ 30 වන පාඩමේ එන ශ්ලෝක නිවැරදි උච්චාරණය සහිත ව සජ්ඣායනා කිරීම
- සංස්කෘත පෙළ බලමින් තනිව කියවීම
- බාලාදර්ශයේ ශ්ලෝක සිංහල අකුරින් ලිවීම
- බාලාදර්ශයේ ශ්ලෝක දේවනාගරී අකුරින් ලිවීම
- බාලාදර්ශයේ ශ්ලෝක වාචෝද්ගත ව ප්‍රකාශ කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- පිරිවෙන් පරිශ්‍රය
- බාලාදර්ශය

# පාඩම 10 - නිර්දිෂ්ටග්‍රන්ථ - බුද්ධගද්‍යය

**නිපුණතාව** : 5.0 නිර්දිෂ්ටග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 5.2 බුද්ධගද්‍යයේ ශ්ලෝක දේවනාගරී අක්‍ෂරවලින් ද, සිංහල අක්‍ෂරවලින් ද, ලියමින් වාචෝද්ගත කරයි.

**කාලච්ඡේද** : 20 යි

**ඉගෙනුම් පල** :

- බුද්ධගද්‍යයේ ශ්ලෝක කට පාඩමින් කියයි.
- බුද්ධගද්‍යයේ ශ්ලෝක සිංහල අක්ෂරවලින් ලියයි.
- බුද්ධගද්‍යයේ ශ්ලෝක දේවනාගරී අක්ෂරවලින් ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- බුද්ධගද්‍යයේ තෝරාගත් ශ්ලෝකයක් සජ්ඣායනා කරන්න.
- මෙම ශ්ලෝකය පන්තියේ සාමූහික සජ්ඣායනයකට යොමු කරන්න.
- බුද්ධගද්‍ය තුළින් බුදුන් වහන්සේගේ ගුණ වයමින් උන්වහන්සේට නමස්කාර කිරීම සිදුවන බව ප්‍රකාශ කරන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- බුද්ධගද්‍යය සිසුන්ට සපයා එහි ශ්ලෝක කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරන්න.
- දිනකට අදාළ ශ්ලෝක සංඛ්‍යාවක් තෝරා ගන්න.
- පළමු ව ශ්ලෝක පන්ති බැඳි අකුරු හා මහාප්‍රාණ නිසිලෙස උච්චාරණය කරමින් හඬනගා කියවන්න.
- ඒවා නැවත නැවතත් සිසුන් හා සාමූහික ව හඬ නගා කියවා නිවැරදි උච්චාරණයට හුරු කරවන්න.
- සිසුන් සමග එම ශ්ලෝක සජ්ඣායනා කරන්න.
- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා මාරුවෙන් මාරුවට පදයෙන් පදය සජ්ඣායනයට ඉඩ සලස්වන්න.
- සිසුන්ට හුරු කරවන ලද ශ්ලෝක නැවත නැවතත් සාමූහික සජ්ඣායනයට ලක් කරන්න.
- එක් එක් ශිෂ්‍යයාට වෙන වෙන ම සජ්ඣායනයට අවස්ථාව ලබා දෙන්න.
- එම ශ්ලෝක වාචෝද්ගත කිරීමට උපදෙස් දෙන්න.

**පියවර 2**

- පෙර පරිදි ඒ ඒ දිනය සඳහා වෙන් කරගත් ශ්ලෝක හුණු පුවරුවේ මාධ්‍ය භාෂාවෙන් නිවැරදි ව ලිවීමට සිසුන් මෙහෙයවන්න.
- ගුරු සහයෝගය ඇති ව ඒවා දේවනාගරී අක්ෂරවලින් ලිවීමට යොමු කරන්න.
- එම ශ්ලෝක සිසුන්ගේ අභ්‍යාස පොත්වල සිංහල අකුරෙන් හා දේවනාගරී අකුරෙන් නැවත ලිවීමට උපදෙස් දෙන්න.
- සෑම ශිෂ්‍යයකුට ම ශ්ලෝකයක් බැගින් පවරා දේවනාගරී අකුරෙන් ද මාධ්‍ය භාෂාවෙන් ද ලියමින් වෙසක් පතක් සකස් කිරීමට සිසුන් යොදවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- බුද්ධගද්‍යයේ ශ්ලෝකවල බැඳි අකුරු හා මහ ප්‍රාණ අක්ෂර නිවැරදි ව උච්චාරණය කරමින් සජ්ඣායනා කිරීම
- බුද්ධගද්‍යයේ ශ්ලෝක මාධ්‍ය භාෂාවෙන් ලිවීම
- බුද්ධගද්‍යයේ ශ්ලෝක දේවනාගරී අකුරෙන් ලිවීම
- බුද්ධගද්‍යයේ ශ්ලෝක වාචෝද්ගත ව ප්‍රකාශ කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- බුද්ධගද්‍යය (බුද්ධපද්‍යය)

**ගුරුවරයාගේ අවධානයට :**

- බුද්ධගද්‍යයේ ශ්ලෝකවල අර්ථය පැහැදිලි කිරීම අපේක්ෂා නොකෙරේ.

# පාඩම 11 - නිර්දිෂ්ටග්‍රන්ථ - සංස්කෘත පාඨමාලා i

**නිපුණතාව** : 5.0 නිර්දිෂ්ටග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 5.3 සංස්කෘත පාඨමාලා 1 ග්‍රන්ථය අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.

**කාලච්ඡේද** : 20 යි

**ඉගෙනුම් පල** :

- සංස්කෘත පාඨමාලා ගීත සිංහල අකුරින් සහ දේවනාගරී අකුරින් ලියයි.
- සංස්කෘත පාඨමාලා 01 හි කතන්දර කියවා, අරුත් පහදයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- සිසුන් පිරිවෙන් පරිශ්‍රයට කැඳවා ගෙන යන්න.
- සංස්කෘත පාඨමාලා ග්‍රන්ථයේ තමා රුචි කරන විශේෂාංගයක් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එම විශේෂාංගය රුචි කිරීමට හේතු විමසමින් ග්‍රන්ථයේ වැදගත්කම සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- සංස්කෘත පාඨමාලා 01 ග්‍රන්ථය දින අනුව කොටස්වලට බෙදා ගන්න.
- සිසුන්ට සංස්කෘත පාඨමාලා 01 ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා එක් කණ්ඩායමකට දේවනාගරී අකුරෙන් ඇති කතන්දරය/ගීතය කියවීමටත්, අනෙක් කණ්ඩායමට එහි අර්ථය ප්‍රකාශ කිරීමටත් උපදෙස් දෙන්න.
- අදාළ තෝරා ගත් කතන්දරයෙහි/ගීතයෙහි පෙළෙහි අර්ථ සාකච්ඡා කරන්න.
- බැඳි අකුරු හා මහ ප්‍රාණ විසර්ග මැනවින් උච්චාරණය කරමින් නැවත නැවතත් කියවීමට සිසුන් තනි තනි ව මෙහෙයවන්න.
- නියමිත දිනයට තෝරා ගත් කොටස එක් එක් ශිෂ්‍යයා ලවා කියවමින් එහි සිංහල අර්ථ විමසන්න.
- කියවන ලද කතන්දරය/ගීතය දේවනාගරී අකුරින් ද මාධ්‍ය භාෂාවෙන් ද, අභ්‍යාස පොතේ ලියවන්න.
- ඇමුණුම 1 අභ්‍යාසය කිරීමට සිසුන් යොදවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- පාඨමාලා ගීත හා කතන්දර සංස්කෘත පෙළ බලා සංයුක්තාක්ෂර හා මහ ප්‍රාණ අක්ෂර මැනවින් උච්චාරණය කරමින් හඬ නගා මැනවින් සජ්ඣායනා කිරීම
- ගීත හා කතන්දර සිංහල අකුරු භාවිතයෙන් ලිවීම
- එම ගීත හා කතන්දරවල අර්ථය පහදා දීම

**ගුණාත්මක යෙදවුම් :**

- සංස්කෘත පාඨමාලා 01 ග්‍රන්ථය

ඇමුණුම 1

පහත සඳහන් ශ්ලෝක සම්පූර්ණ කරන්න.

සරසිජ නිඃශ්‍රැත විරචිත තන්ත්‍ර

...........................................................................................

...........................................................................................

...........................................................................................

බහුලෝලකඨනීය රාවාධි රාව

...........................................................................................

...........................................................................................

...........................................................................................

පුස්තකස්ථා ච යා විද්‍යා

...........................................................................................

...........................................................................................

...........................................................................................

ආචාර්යාත් පාදමාදත්තේ

...........................................................................................

...........................................................................................

...........................................................................................

පහත සඳහන් ශ්ලෝක දේවනාගරී අකුරු භාවිත කරමින් ලියන්න.

ප්‍රේරිත ශාසන නීති විශාල ධාරිත බෝධි මනෝහර මූල
වාරිත මාර වධූජන ලීල පූරිත පාරමිතා දශශීල

.................................................................................................................................................

.................................................................................................................................................

ප්‍රථිත චරිත සඞ්ග ගීති නීති සදන අමිත විමල ධර්මශීල නීති සදන
බහල ධවල පුඞ්ජහාර චාරු රදන ශිශිර කිරණ මණ්ඩලාභිරාම වදන

.................................................................................................................................................

.................................................................................................................................................

පහත සඳහන් ශ්ලෝකය දේවනාගරී අකුරු භාවිත කරමින් ලියන්න.

ප්‍රසුත ප්‍රහිත ප්‍රසව ප්‍රචල ප්‍රථිත ප්‍රගුණ ප්‍රමද ප්‍රඵල
ප්‍රණත ප්‍රචුර ප්‍රභව ප්‍රදල ප්‍රතත ප්‍රණය ප්‍රතිම ප්‍රබල

.................................................................................................................................................

.................................................................................................................................................

ත්‍යජ දුර්ජන සංසර්ගං භජ සාධු සමාගමම්
කුරු පුණ්‍යමහෝරාත්‍රං ස්මර නිත්‍යමනිත්‍යතාම්

.................................................................................................................................................

.................................................................................................................................................

පහත සඳහන් ශ්ලෝක සිංහල අකුරු භාවිත කරමින් ලියන්න.

स्वगृहे पूज्यते मूर्खः स्वग्रामे पूज्यते प्रभुः।
स्वदेशे पूज्यते राजा विद्वान् सर्वत्र पूज्यते॥

.................................................................................................................................................

.................................................................................................................................................

सत्यं माता पिता ज्ञानं धर्मो भ्राता दया सखा ।
शान्तिः पत्नी क्षमा पुत्रः षडेते मम बान्धवाः ॥

..............................................................................................................................................

..............................................................................................................................................

පහත වාක්‍යවල හිස්තැනට වඩාත් නිවැරදි වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

( नन्दति / उपायं / शीघ्रम् / एकः काकः / लिखामि / नदीतीरे / चन्दिर / लीयसे / अगच्छं / धावसि / लज्जितः / सूर्यो / नमामि / वर्षति / गायाम)

०१. उदयति ............................... नीलसमुद्रात् ।

०२. मनः प्रसन्नं ............................... हृदयं ।

०३. सः एकं ............................... अचिन्तयत् ।

०४. एकस्मिन् ग्रामे ............................... वसति ।

०५. अहं ............................... संस्कृतम् ।

०६. अहं ............................... मातरम् ।

०७. मेघो ............................... प्रवहति नीरम् ।

०८. एहि एहि ............................... श्वेतकिरण सुन्दर ।

०९. ............................... एकः मण्डूकः वसति ।

१०. देवदारु पृष्ठतः ............................... किम् ।

११. अहम् ............................... राजनिवासं ।

१२. मित्र त्वं किमर्थं ............................... ।

१३. शशकः ............................... अभवत् ।

१४. अहो दिनमिदं परमसुखकरं ............................... च नृत्याम ।

१५. अयं घोटकः धावति ............................... ।

# ඇගයීම හා තක්සේරුකරණය

# හැඳින්වීම

පිරිවෙන්වල භාවිතය සඳහා සකස් කරන ලද මෙම ගුරු මාර්ගෝපදේශය තුළින් නිපුණතා පාදක විෂයමාලාව හඳුන්වා දීමේ දී **පාසල පදනම් කරගත් තක්සේරුකරණය** පිළිබඳ මේ වන විට ඔබ මනා වැටහීමක් ලබා තිබිය යුතු ය. ඔබ ගේ පහසුව සඳහා මෙම ගුරු මාර්ගෝපදේශයේ ද එම විස්තර පහත දක්වා ඇත.

ඉගෙනුම, ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත්, ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැන ගැනීම පිණිස ඇගයීම යොදා ගත යුතු බවත්, සෑම ගුරුවරයකු විසින් ම දතයුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත්, එ සේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත්, ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදු වන) ඇගයීම් මූල ධර්ම අනුව ඇගයීම සිදු විය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑ ම අවස්ථාවක දී සිදු විය හැකි ය. එ ලෙස තම සිසුන් ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම හා සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදා ගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන් ගේ ඉගෙනීමත්, ගුරුවරුන් ගේ ඉගැන්වීමත්, වැඩි දියුණු කිරීම සඳහා යොදා ගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීප ව සිටිමින් ඔවුන් ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන් ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩ පිළිවෙළකි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල පදනම් කර ගත් ඇගයීම් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහි දී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයීමට ලක් විය යුතු අතර ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදු වන්නේ දැ යි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ගුරුවරයා ගේ කාර්යභාරය යි. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (feed Forward) යනුවෙනි. සිසුන් ගේ දුබලතා අනාවරණය කොට ගෙන ඒවාට පිළියම් යෙදීම ප්‍රතිපෝෂණයෙන් සිදු කෙරෙන අතර, ප්‍රබලතා වැඩි දියුණු කිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගැනීම ඉදිරි පෝෂණයෙන් සිදු කෙරේ.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතුරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් වූයේ ද යි අනාවරණය කර ගැනීම අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන් ගෙන් බලාපොරොත්තු වන අතර එම තත්ත්වය සිසුන්ට සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු ය. මේ සඳහා පවත්නා හොඳ ම ක්‍රමය වන්නේ පාසල පදනම් කර ගත් ඇගයීම් ක්‍රමය යි. යථෝක්ත අරමුණ සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් කාර්යයත්, සිසුන්ගේ ඉගෙනුම් කාර්යයත්, කාර්යක්ෂම කිරීම පිණිස වඩාත් හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට හා ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද, ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද, යෝජනා කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ.

| | | | |
|---|---|---|---|
| 1. | පැවරුම් | 2. | ව්‍යාපෘති |
| 3. | සමීක්ෂණ | 4. | ගවේෂණ |
| 5. | නිරීක්ෂණ | 6. | ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම |
| 7. | ක්ෂේත්‍ර චාරිකා | 8. | කෙටි ලිඛිත පරීක්ෂණ |
| 9. | ව්‍යූහගත රචනා | 10. | විවෘත ග්‍රන්ථ පරීක්ෂණ |
| 11. | නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 12. | ශ්‍රවණ පරීක්ෂණ |
| 13. | ප්‍රායෝගික ක්‍රියාකාරකම් | 14. | කථනය |
| 15. | ස්වනිර්මාණ | 16. | කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| 17. | සංකල්ප සිතියම | 18. | ද්විත්ව සටහන් ජර්නල |
| 19. | බිත්ති පුවත්පත් | 20. | ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් |
| 21. | ප්‍රශ්න හා පිළිතුරු පොත් | 22. | විවාද |
| 23. | සාකච්ඡා මණ්ඩල | 24. | සම්මන්ත්‍රණ |
| 25. | ක්ෂණික කථා | 26. | භූමිකා රංගන |

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සෑම එකක් මත්, සෑම විෂයක් සම්බන්ධයෙන් මත්, සෑම විෂය ඒකකයකට මත්, යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. තම විෂයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වග බලාගත යුතු ය. එහි දී උචිත නිර්ණායක පදනම් කරගෙන ඇගයීම් ආධාරක සකස් කොට ඇගයීම් කාර්යය සිදු කළ යුතු වේ.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය

1. වාරය ඃ පළමු වාරය

2. ආධාරක අංකය ඃ 01

3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම ඃ 1.1

4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය ඃ 1.1 දේවනාගරී අක්ෂර
   ස්වරාක්ෂර 14
   ව්‍යඤ්ජනාක්ෂර 35

5. ආධාරකයේ ස්වභාවය ඃ කාඩ්පත් කට්ටලයක් සැකසීම

6. ආධාරකයේ අරමුණු ඃ
   - සිංහල හෝඩියේ සහ දේවනාගරී හෝඩියේ අක්ෂර රූප සංසන්දනය කිරීම
   - දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර සහ ව්‍යඤ්ජනාක්ෂර නිවැරැදි ව කියවීම හා ලිවීම

7. ආධාරකය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්
   ගුරු උපදෙස් ඃ

- පන්තියේ සිසුන් සියලු දෙනාට ම 10cm x 10cm ප්‍රමාණයේ කාඩ්පත් ලබා දෙන්න.

- එහි එක් පැත්තක දේවනාගරී අක්ෂරය ද, අනෙක් පැත්තේ සිංහල අක්ෂරය ද, ලිවීමට උපදෙස් දෙන්න.

- ස්වරාක්ෂර එක් වර්ණයකින් ද, ව්‍යඤ්ජනාක්ෂර තවත් වර්ණයකින් ද ලිවිය යුතු බවට සිසුන් දැනුවත් කරන්න.

- සියලු ම කාඩ්පත්වල දේවනාගරී අක්ෂරය උඩු පැත්තට හරවා ඒවායේ වම් ඉහළ කෙළවරේ සිදුරක් විද යතුරු කැරැල්ලක් ආකාරයට සනකම් නූලකින් ලිහිල් ව අමුණන්නට සිසුන්ට සහාය වන්න.

- සිංහල අක්ෂරය දෙස බලා ඊට අදාළ දේවනාගරී අක්ෂරයත්, දේවනාගරී අක්ෂරය දෙස බලා ඊට අදාළ සිංහල අක්ෂරයත් උච්චාරණයට සහ ලිවීමට මෙය යොදා ගත හැකි ආකාරය සිසුන්ට පහදන්න.

සිසු උපදෙස් ඃ

- ගුරු උපදෙස් අනුව තනි තනි ව කාඩ්පත් සකසන්න.
- සාමූහික ව සකසන ලද කාඩ්පත් එකතු කොට නියමිත පරිදි කට්ටලයක් වශයෙන් ගොනු කරන්න.
- කාඩ්පත් කට්ටලය ස්වයං අධ්‍යයන උපකරණයක් ලෙස භාවිත කරමින් දේවනාගරී අක්ෂර පිළිබඳ දැනුවත් බව අනාවරණය කර ගන්න.
- කාඩ්පත් කට්ටලය යොදා ගනිමින් ඔබ සියලු දෙනා අතර තරගයක් පවත්වන්න.
- නිර්ණායක මැනවින් තේරුම් ගෙන උසස් ලෙස කණ්ඩායමේ කාර්යය සිදු කරන්න.

| | නිර්ණායකය | සිසුන්ගේ නම් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |
| 1. | ලොකුවට අකුරු ලිවීම | | | | | | | | | |
| 2. | අක්ෂර රූප නිවැරදි බව | | | | | | | | | |
| 3. | පැහැදිලි ව ලියා තිබීම | | | | | | | | | |
| 4. | උච්චාරණයට යොදා ගැනීම | | | | | | | | | |
| 5. | සාමූහික ව කටයුතු කිරීම | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | |

ලකුණු පරාසය

- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථ යි 02
- සංවර්ධනය විය යුතු ය 01

මුලින් ලකුණු 20ක් ප්‍රදානය කොට දෙවනු ව එය දෙකෙන් බෙදා අවසාන ලකුණු සටහන් කිරීම නිර්දේශ කෙරේ. ශිෂ්‍යයා ලබා ගත් ලකුණු ඔත්තේ සංඛ්‍යාවක් නම් දෙකෙන් බෙදූ විට ඉතිරියක් වන නිසා එය ධනාත්මක අගයකින් පූර්ණ සංඛ්‍යාවට වටයන්න. මේ ලකුණු ඇසුරෙන් ශිෂ්‍ය නිපුණතා මට්ටම තීරණය කෙරේ.

| | |
|---|---|
| 9-10 | විශිෂ්ට මට්ටමේ නිපුණතාව |
| 8 | ඉහළ මට්ටමේ නිපුණතාව |
| 6-7 | සම්මාන මට්ටමේ නිපුණතාව |
| 4-5 | ආසන්න මට්ටමේ නිපුණතාව |
| 5 ට අඩු | නිපුණතාවට ළඟා නො වූ |

මෙය නිදර්ශක ආධාරකයක් පමණි. ගුරුවරයාට ස්වාධීන ව ආධාරක සැලසුම් සකස් කරගත හැකි ය.

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2018

Primary Piriven Year End Test - 2018

1 ශ්‍රේණිය / Grade 1

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**සංස්කෘත භාෂාව** | කාලය : පැය දෙකයි

**Sanskrit** | විභාග අංකය :- ................ | Time : Two hours

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.**

01. පහත සඳහන් දේවනාගරී අකුරු සිංහල අකුරින් ලියන්න.

| उ | त्व | श | ढ | छ | ज्ञ | नौ | ज | तो | ह्य |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(ලකුණු 1 x 10 = 10 යි)

02. පහත සඳහන් සිංහල අකුරු දේවනාගරී අකුරින් ලියන්න.

| සු | කෘ | ෂ | ජෛඃ | ඨ | හ | ඵ | සූ | ඛ | බ |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(ලකුණු 1 x 10 = 10 යි)

03. පහත සඳහන් සංස්කෘත වචන සිංහල අකුරින් ලියන්න.

i. उटजः : ..............................  ii. झरः : ..............................

iii. साधवे : ..............................  iv. धनिकैः : ..............................

v. प्रभुम् : ..............................  vi. चन्द्रः : ..............................

vii. अलिखाव : ..............................  viii. वाल्मीकः : ..............................

(ලකුණු 1 x 8 = 08 යි)

04. පහත සඳහන් සිංහල වචන දේවනාගරී අකුරින් ලියන්න.

i. පුරුෂ : ..............................  ii. ලෙඛනම් : ..............................

iii. රථෙන : ..............................  iv. ශුකෛඃ : ..............................

v. භූපති : ..............................  vi. යුද්ධාය : ..............................

vii. තිෂ්ඨති : ..............................  viii. පශ්‍යාව : ..............................

(ලකුණු 1 x 8 = 08 යි)

5. අ. පහත දැක්වෙන සංඛ්‍යා, දේවනාගරී ඉලක්කමෙන් ලියන්න.

i. 7 : ..............................  ii. 36 : ...............................

iii. 50 : ..............................  iv. 2018 : ...............................

v. 19482 : ..............................  (ලකුණු 1 x 5 = 05 යි)

ආ. පහත දැක්වෙන දේවනාගරී සංඛ්‍යා, සාමාන්‍ය ඉලක්කමෙන් ලියන්න.

i. ८ : ..............................  ii. २३६ : ...............................

iii. ४७० : ..............................  iv. १९८५ : ...............................

v. २६०१९ : ..............................  (ලකුණු 1 x 5 = 05 යි)

06. අ. පහත සඳහන් **कपि** ශබ්දයේ හිස්තැන් පුරවන්න.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | कपिः | | कपयः |
| सम्बोधन | | | हे कपयः |
| द्वितीया | कपिम् | कपी | कपीन् |
| तृतीया | | कपिभ्याम् | |
| चतुर्थी | कपये | | |
| पञ्चमी | कपेः | कपिभ्याम् | कपिभ्यः |
| षष्ठी | | कप्योः | कपीनाम् |
| सप्तमी | | | कपिषु |

(ලකුණු 1 x 10 = 10 යි)

ආ. √**गम्** ධාතුව (**गमिष्यति**) අනාගත (ලෘට්) පරස්මෛපදයෙහි වරනගා දක්වන්න.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | गमिष्यति | | |
| मध्यमपुरुष | | | गमिष्यथ |
| उत्तमपुरुष | | गमिष्यावः | |

(ලකුණු 1 x 6 = 06 යි)

07. පහත සඳහන් වාක්‍ය සිංහලයට නගන්න.

i. त्वं वदसि । ....................................................................................

ii. बालकः पठति । ....................................................................................

iii. आवां पश्यावः । ....................................................................................

iv. जनकाः नमन्ति । ....................................................................................

(ලකුණු 2 x 4 = 08 යි)

08. පහත සඳහන් වාක්‍ය සංස්කෘතයට නගා දේවනාගරී අකුරින් ලියන්න.

i. අපි වදිමු. ....................................................................................

ii. ළමයි ක්‍රීඩා කරති. ....................................................................................

iii. පරෙවියා නද දෙයි. ....................................................................................

iv. ඔවුහු දෙදෙන ගමට යත්. ....................................................................................

(ලකුණු 2 x 4 = 08 යි)

09. පහත වාක්‍යවල හිස්තැනට වඩාත් නිවැරදි වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

[ लीयसे / उपायं/ मण्डूकः / राजनिवासं/ वदामि ]

i. अहं …………….. संस्कृतम् ।

ii. अहं …………….. अगच्छम् ।

iii. देवदारुपृष्ठतः …………….. किम् ?

iv. सः एकं …………….. अचिन्तयत् ।

v नदीतीरे एकः …………….. वसति ।

(ලකුණු 2 x 5 = 10 යි)

10. අ. පහත සඳහන් ශ්ලෝකය සම්පූර්ණ කරන්න.

අනුසමය ශුභසාර භූෂණ

.......................................................................................

.......................................................................................

.......................................................................................

(ලකුණු 03 යි)

ආ. පහත සඳහන් ශ්ලෝකය සම්පූර්ණ කරන්න.

ගච්ඡන් පිපීලිකෝ යාති

.......................................................................................

.......................................................................................

.......................................................................................

(ලකුණු 03 යි)

ඉ. පහත සඳහන් ශ්ලෝකය දේවනාගරී අකුරු භාවිත කරමින් ලියන්න.

ප්‍රසුත ප්‍රහිත ප්‍රසව ප්‍රචල - ප්‍රථිත ප්‍රගුණ ප්‍රමද ප්‍රඵල
ප්‍රණත ප්‍රචුර ප්‍රභව ප්‍රදල - ප්‍රතත ප්‍රණය ප්‍රතිම ප්‍රබල

.......................................................................................

.......................................................................................

.......................................................................................

.......................................................................................

(ලකුණු 04 යි)

ඊ. පහත සඳහන් ශ්ලෝකය සිංහල අකුරු භාවිත කරමින් ලියන්න.

आचार्यात् पादमादत्ते - पादं शिष्यः स्वमेधया ।
पादं सब्रह्मचारिभ्यः - पादं कालक्रमेण च ॥

.......................................................................................

.......................................................................................

.......................................................................................

.......................................................................................

(ලකුණු 02 යි)